# සමාජ විද්‍යාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

## 3 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : Pirivena@moe.gov.lk



මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සමාජ විද්‍යාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2019

ISBN - 978-955-25-0527-0

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් ලිපිනය** : info@nie.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හොරණ, මිදෙල්ලමුලහේන, තල්ගහවිල පාර, අංක 65C හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය බෞද්ධ ජාතික අනන්‍යතාවයේ සංකේතය භික්ෂූන් වන්සේය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිටම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල්ව වැඩී ගියාද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වනවිට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිගමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කරගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතුය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා පරිවෙණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබාදීම පරිවෙණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැපවූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තූතිය පළකරමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් තුමාගේ පණිවිඩය

පිරිවෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේයය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලුම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54 ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමුව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පංති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පංති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

## පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙනට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකීය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වාම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන්ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂී පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්නතිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහිකිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේදී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේලා අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙන පෙරටත් වඩා ශක්තිමත්ව ක්‍රියාත්මක විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශයන් යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකිවීම සතුටට හේතුවකි.  විවිධ උපාය මාර්ගයන් ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේදී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්යවරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියාකිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙසද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලිකව ක්‍රියාකළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ හිමියන්ගේ, පිරිවෙන් ශාඛා ප්‍රධානී හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රශංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි<br>පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | ගමගේ විකුම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික විෂය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය විශේෂඥ උපදේශනය** | : | ඒ. කේ. ජී. ජයසිංහ<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br>රුහුණු විශ්ව විද්‍යාලය |
| | | පූජ්‍ය උඩුගම්පොළ ගුණානන්ද හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ලංකා භික්ෂුවිද්‍යාලය, අනුරාධපුර |

| | | |
|---|---|---|
| **ලේඛක මණ්ඩලය** | : | ඩබ්. ඒ. කේ. සුදර්ශනී<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම |
| | | ගමගේ වික්‍රම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | පූජ්‍ය ඇලදුවේ පඤ්ඤාතිලක හිමි<br>නියෝජ්‍ය පරිවෙණාධිපති<br>කො/ සුනේත්‍රාදේවී පිරිවෙණ, පැපිලියාන |
| | | පූජ්‍ය ගල්ගමුවේ ගුණරතන හිමි<br>පරිවේණාචාර්ය<br>ශ්‍රී රතනපාල පිරිවෙණ, මීගහගොඩ, පැල්මඩුල්ල |
| | | පී. ජී. ජයන්ත ආනන්ද<br>පරිවේණාචාර්ය<br>කෑ/ ශ්‍රී විද්‍යාමංගල මහ පිරිවෙන, මංගලගම, ගිරිඋල්ල |
| | | එම්. ඩී. අකිල රත්නකුමාර<br>ගුරු උපදේශක<br>කු/ පඤ්ඤානන්ද මූලික පිරිවෙණ, මාහරගම, ගිරිඋල්ල |
| | | පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය, බත්තරමුල්ල |
| **භාෂා සංස්කරණය** | : | පූජ්‍ය රත්මලවිට චන්ද්‍රානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය),<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |
| **සෝදුපත් කියවීම** | : | කුඹල්ගොඩ ධම්මාලෝක හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක (විෂය සම්බන්ධීකරණ)<br>පිරිවෙන්, අධ්‍යාපන අමාත්‍යාංශය<br>පිරිවෙන් ආයතන ශාඛාව |
| **පරිගණක වදන්** | : | ආර්. ඒ. යුරේකා දිල්රුක්ෂි<br>පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **පිටකවර නිර්මාණය** | : | තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක විද්‍යාව),<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |

# හැඳින්වීම

දර්ශනය, නීතිය, ආගම, ආර්ථිකවිද්‍යාව, මනෝවිද්‍යාව, දේශපාලනවිද්‍යාව ආදී වශයෙන් වන අනෙකුත් සියලු සමාජීය විද්‍යා ගණයට අයත් විෂයයන් බිහි වී භාවිතයට ගැනෙමින් පැවති ශාස්ත්‍රීය ලෝකයට, තව දුරටත් පුරවා ගත යුතු ඉතා වැදගත් හිඩැසක් ඇති බව කාර්මීකරණයත් සමග ම ගොඩ නැගෙන නව සමාජ පරිසරයෙහි උද්ගත වන්නට විය. 19 වැනි සියවසේ මැද භාගය වන විට එකී අවශ්‍යතාව ඉතාමත් දැඩිව දැනෙන්නට විය. ඒ මත ගොඩ නැගුණු දිගු කාලීන සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස මෙකී අඩුව පුරවාලීම සඳහා යෝග්‍ය විෂයයන් ලෙස යෝජනා රැසක් ඉදිරිපත් වූයේ ය. එහෙත් අවසානයේ ඒ අතරින් ශාස්ත්‍රීය ලෝකය තුළ පිළිගැනීමට ලක් වූයේ ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු වූ ඔගස්ට් කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව යි. ඒ වන විට යුරෝපාකරයේ අළුතින් බිහි වූ කාර්මික හා නාගරික සමාජ ඇසුරෙහි උද්ගත වෙමින් පැවති විවිධාකාර ආගන්තුක අභියෝග තේරුම් ගැනීමට වඩාත් යෝග්‍ය නව විෂය ලෙස ඔගස්ට් කොම්ට් විසින් යෝජනා කරන ලද්දේ "සමාජවිද්‍යාව" (Sociology) යන්නයි. මනුෂ්‍ය ශරීරය අධ්‍යයනය කිරීම සඳහා ජීවවිද්‍යාව (Biology) යම් සේ වැදගත් වන්නේ ද ඒ තරමට ම සමාජය නමැති සිරුර අධ්‍යයනය කිරීම සඳහා සමාජ විද්‍යාව වැදගත් වන බව එහි දී කොම්ට් විසින් පෙන්වා දෙන ලදී.

මිනිසාගේ සමස්ත සමාජ චර්යාව විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂය සමාජ විද්‍යාව යි. ඒ අනුව කවර හෝ සමාජයක් පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක යෙදෙන්නට හැකි එක ම විෂය වන්නේ සමාජ විද්‍යාව බව කොම්ට්ගේ තර්කය විය. සමාජ විද්‍යාව නමැති විෂයයේ සැබෑ කාර්යභාරය දෙස බලන විට කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද මෙම තර්කය බැහැර කළ නොහැකි වේ.

සමාජීය සත්ත්වයෙකු ලෙස සෑම මනුෂ්‍යයෙකුට ම තමා සාමාජිකත්වය දරන සමාජය පිළිබඳ මෙන් ම එයින් බැහැර ලෝක සමාජය පිළිබඳව ද මනා අවබෝධයක් තිබිය යුතු වේ. එසේ නොවන තැන සමාජයේ පාර්ශ්වයෙන් සාමාජිකයාට ලබා දිය යුතු සෙවන හා රැකවරණය නොලැබෙන්නට හෝ අඩුපාඩු සහගත වන්නට පුළුවන. අනෙක් අතට සාමාජිකයාගේ පාර්ශවයෙන් සමාජය උදෙසා ඉටු විය යුතු අනුපමේය මෙහෙවර මගහැරී යනු නොඅනුමාන ය. මේ අනුව පැහැදිලි වන්නේ සාමාජිකයා සමාජය මත මෙන් ම අනෙක් අතට සමාජය සාමාජිකයා මත රඳා පවතින බව යි. සමාජයක් යනු මෙම අන්‍යෝන්‍ය ගනුදෙනුවේ අවසන් ප්‍රතිඵලය යි. මෙය සර්ව විශ්වීය හා සර්ව කාලීන වශයෙන් එක හා සමානව වලංගු යතාර්ථයකි. කවර හෝ සමාජයක ජීවත් වන සෑම සාමාජිකයෙකු ම මෙම යතාර්ථය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත විය යුතු ය. සමාජයේ මෙන් ම සාමාජිකයාගේ ප්‍රගමනය යතාර්ථයක් බවට පත් වන්නේ එවැනි අවබෝධයකින් යුක්ත වන්නේ නම් පමණි. මේ අනුව පිරිවෙන් අධ්‍යාපනය සඳහා යොමු වන සිසුනට ලබා දෙනු ලබන සමාජවිද්‍යා විෂය දැනුම පැවිදි හෝ ගිහි ප්‍රභේදයකින් තොරව කෙතරම් වැදගත් වන්නේ ද යන්න මනාව තහවුරු වේ.

ඉහත දක්වන ලද කෙටි හැඳින්වීම දෙස අවධානයෙන් බලන විට, සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රය කෙතරම් සංකීර්ණ එකක් වන්නේ ද යන්න තේරුම් ගැනීමට අපහසු නොවනු ඇත. මෙම ගුරු මර්ගෝපදේශය සම්පාදනය කිරීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ, ආරම්භක වසර (තුන ශ්‍රේණිය) සිසුනට ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කිරීම හා එහි දී ගුරුවරයා කවර මට්ටමකට සීමා විය යුතු ද යන්න නිශ්චය කර දීම ය. පාඩම් 7 ක් යටතේ සැලසුම් කරන ලද මෙම මාර්ගෝපදේශය මගින් ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කරන අතර ම ශිෂ්‍යයා මෙන් ම ගුරුවරයා ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සක්‍රීය සාමාජිකයෙකු බවට පත් කිරීමට පොළඹවනු ලැබේ. ශිෂ්‍යයාට උවමනා දැනුම සම්පාදනය කර දීම සඳහා ගුරුවරයාට ද නිරතුරුව සිය විෂය දැනුම යාවත්කාලීන කර ගැනීමට සිදුවන හෙයිණි. එමෙන් ම නිර්දේශිත ආකෘතියට අනුව ඉගැන්වීමෙහි නියැලෙන ගුරුවරයා ද රාජකාරිමය ආතතියෙන් තොර, විවිධත්වයෙන් හෙබි අතිශය තෘප්තිමත් සමාජ මෙහෙවරක යෙදෙන්නෙකු බවට පත් වනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය ලෙස වර්තමානයට වඩා සශ්‍රීක ගුරු පරපුරක් අනාගතයේ දී අපේක්ෂා කළ හැකි බවට පුරෝකථනය කිරීමට ද අවකාශයක් ඇත. විෂයයෙහි සක්‍රීය භූමිකාවක් රඟ දක්වන ගුරුවරයා පර්යේෂණාත්මක ලිපි ලේඛන මෙන් ම පොත් පත් ද සම්පාදනය කිරීමට පෙළඹෙනු ඇති හෙයිණි.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

පිරිවෙන් අධ්‍යාපනය යටතේ සමාජ විද්‍යා විෂයය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරු මාර්ගෝපදේශයෙන් හඳුන්වා දීමට ලැබීම පිරිවෙන් අධ්‍යාපන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමේ ඉදිරි පියවරක් ලෙස දකිමි. මෙහි දී නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට අවතීර්ණ වීම ද සිදු කර ඇත.

විෂය අන්තර්ගතයට අදළ පාඩම් මාතෘකා ප්‍රධාන නිපුණතාවයක් කරා ළඟා විය හැකි පරිදි කාලච්ඡේද වලට අනුකූලව නිපුණතා මට්ටම්වලට එළඹීමට හැකි වන පරිදි පාඩම් සැලසුම් කර ඇත. එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට නිවැරදි මග පෙන්වීම සඳහා හේතු වන අතර ශිෂ්‍යයන් හට තම සාධනීය මට්ටම කරා ළඟා වීමට වඩාත් පහසු වනු ඇත.

වඩා කාර්යක්ෂම ඉගෙනුම් ක්‍රියාවලියක අග්‍ර ඵලය වන්නේ දැනුම, කුසලතා, ආකල්ප හා සාරධර්ම පිළිබඳව මනා සංයෝගයෙන් යුතු පුරවැසියෙකු බිහිකිරීමයි. සංයෝගයෙන් ගොඩනැගෙන ජීවන පුරුද්දයි. එනම් නිපුණතාවක් ලෙස අප අපේක්ෂා කරනුයේ එම දැනුම, කුසලතා, ආකල්ප හා සාරධර්මවල සංයුතියයි. ඒ අනුව නිපුණතා මට්ටමට එළඹීම සඳහා භික්ෂු කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය පෙරටු කර ගනිමින් පාඩම් සැලසුම් කිරීමට ද අවධානය යොමු කර ඇත. මෙහිදී සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, ගවේෂණය, විවාද, කථන අවස්ථා ආදි ඉගෙනුම් ක්‍රමයේ දී භාවිතය මගින් පාඩම් අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දී ඇත.

ඇගයීම යටතේ, ශිෂ්‍යයා අපේක්ෂා කරන මට්ටම කරා ළඟා කරවීමට නිරීක්ෂණය පදනම් කර ගත් ඇගයීම් ක්‍රියාවලියට පිවිසීමට ගුරුවරයාට ඉඩ කඩ සලසා දී ඇත.

මේ අනුව සමාජ විද්‍යා විෂයය ගුරු මාර්ගෝපදේශය නිපුණතා පාදකව ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද ඇසුරින් වඩාත් ඵලදායී මෙන් ම කාර්යක්ෂම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ සංවිධානය කර ඇත.

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ පණිවිඩය III
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය IV
- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය V
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VI
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය VII
- ගුරු මාර්ගෝපදේශක සම්පාදක මණ්ඩලය VIII-IX
- හැඳින්වීම X
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් XI
- පටුන XII
- සමාජ විද්‍යාව 3 ශ්‍රේණිය - වාර නියමය XIII
- පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු XIV
- විෂය නිර්දේශය - 3 වන ශ්‍රේණිය XV- XXXII
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXIII

1. සමාජ විද්‍යාව හැඳින්වීම 01 - 17
2. සමාජ පරිණාමය 17 - 27
3. සංස්කෘතිය 28 - 39
4. පුද්ගලයා හා සමාජය 40 - 49
5. සමාජ පාලනය 50 - 55
6. සමාජ ගැටලු 56 - 65
7. සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කිරීම. 66 - 76

## සමාජ විද්‍යාව 3 ශ්‍රේණිය - වාර නියමය

| වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|
| I වාරය | 1.1, 1.2, 1.3, 1.4<br>2.1, 2.2, 2.3, 2.4 | 24 |
| II වාරය | 3.1, 3.2, 3.3. 3.4<br>4.1, 4.2, 4.3, 4.4<br>5.1, 5.2, 5.3 | 27 |
| III වාරය | 6.1, 6.2, 6.3, 6.4<br>7.1, 7.2, 7.3 | 20 |

## 1 වැනි කොටස

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා, වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ වන්නේය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රයෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘතික ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසාදීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත**

# සමාජ විද්‍යාව

## විෂය නිර්දේශය

## 3 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිළිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- » නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය,
- » කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතාඃ
- » ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- » චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිකලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා වියකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. (උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## සමාජ විද්‍යාව විෂයයේ අරමුණු

මූලික පිරිවෙන් විෂය මාලාවේ වෛකල්පික විෂයයක් ලෙස සමාජ විද්‍යාව විෂයය තුන්වන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක වේ. මේ විෂය අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

01. යහපත් සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට අවස්ථාව උදා වීම.
02. පවුලේ/ පන්සලේ/ පිරිවෙනේ සාමාජිකයෙක් වශයෙන් ඔබෙන් සමාජයටත්, සමාජයෙන් ඔබටත් ඉටු විය යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීම.
03. නිවැරදි ජීවන අරමුණු තුළින් ජීවිතය ජය ගැනීම.
04. සමාජ වෙනස්වීම් හඳුනා ගෙන ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීමට පෙළඹීම.
05. තම අනන්‍යතාව රැක ගනිමින් සමාජයට පිවිසීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීම.
06. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ පවතින සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගෙන ක්‍රියා කිරීමට අවස්ථාව උදාකර ගැනීම.
07. බුදුදහම ඇසුරින් ශ්‍රී ලාංකේය සමාජය තුළ සිදු වූ පරිවර්තනයන් අධ්‍යයනය කිරීමට හැකියාව ලැබීම.
08. සමාජ පාලනයට හේතුවන සාධක හඳුනා ගෙන ඒ ඒ සාධකවල වටිනාකම ඇගයීම.
09. සමාජ ප්‍රශ්න/ ගැටලු හඳුනා ගෙන ඊට සාධාරණ විසඳුම් සෙවීමේ අවස්ථාව උදාකර ගැනීම.
10. සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් පවතින බව දැන ගැනීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී. | 1.1 සමාජ විද්‍යාවේ බිහිවීම හා වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි. | **1.1 සමාජ විද්‍යාව හැඳින්වීම**<br>• සමාජ විද්‍යාවේ ප්‍රභවය හා විෂය වර්ධනය වූ ආකාරය | • දහනවවන සියවසේ සමාජ විද්‍යාවේ බිහිවීම හා විෂය වර්ධනය වූ ආකාරය පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාවේ ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාවේ බිහිවීම සමාජමය අවශ්‍යතාවක් බව පෙන්වා දෙයි.<br>• සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් හඳුනාගෙන ඔවුන්ගේ මතවාද අධ්‍යයනය කරයි. | 02 |
| | 1.2 සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජනවල වැදගත්කම අගය කරයි. | **1.2 සමාජ විද්‍යා විෂයයේ අරමුණු හා ප්‍රයෝජන**<br>• සමාජ විද්‍යා විෂයයේ අරමුණු හා ප්‍රයෝජන | • සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජනවල වැදගත්කම අගයමින් අදහස් දක්වයි.<br>• සමාජ විද්‍යාවේ ප්‍රධාන තේමාවන් නම් කරයි.<br>• සමාජ වෙනස්වීමට බලපාන සංකල්ප ප්‍රකාශ කරයි.<br>• සමාජ ප්‍රශ්න පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 1.3 සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුනාගෙන විස්තර කරයි. | **1.3 සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හා එහි විෂය ක්ෂේත්‍රය**<br>• සමාජ සමූහ<br>• තත්ත්වය හා කාර්ය කොටස<br>• සමාජ වෙනස්වීම<br>• සමාජානුයෝජනය<br>• සංස්කෘතිය | • සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සමූහයක ඇති මූලික ලක්ෂණ පෙන්වා දෙයි.<br>• සාමාජික එකතුවක් කවර සමූහයකට අයත් වන්නේ ද ප්‍රකාශ කරයි.<br>• අවට සමාජයේ හමුවන විවිධ සමාජ තත්ත්වයන් නම් කරයි.<br>• තත්වයන්ට අදාළ කාර්ය කොටස විග්‍රහ කරයි.<br>• සමාජ වෙනස්වීම ගවේෂණය කරයි.<br>• සමාජානුයෝජන කාරක නම් කරයි.<br>• සංස්කෘතිය පැහැදිලි කරයි. | 02 |
| | 1.4 සමාජගැටලුවිශ්ලේෂණයේ දී හා නිවාරණයේ දී බුදු දහම ප්‍රශස්ත බව පවසයි. | **1.4 බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සමාජ විද්‍යාව ඉගෙනීමේ අවශ්‍යතා** | • ගැටලු විශ්ලේෂණයේ දී හා නිවාරණයේ දී බුදු දහම ප්‍රශස්ත බව පවසයි.<br>• නායකත්වය සඳහා සමාජ විද්‍යා දැනුමේ ඇති ප්‍රයෝජන ගෙන හැර දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • සමාජ ගැටලු නම් කරයි.<br>• සංකීර්ණ සමාජයේ විවිධ චරිත හඳුනා ගැනීමට සමාජ විද්‍යාව උපකාරී වන අයුරු ප්‍රකාශ කරයි. | |
| 02. සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි. | 2.1 ප්‍රාථමික අවදියේ සිට නූතන අවදිය දක්වා සමාජය වෙනස් වූ ආකාරය විස්තර කරයි. | **2.1 සමාජ පරිණාමය**<br>• සමාජ පරිණාමය පිළිබඳ සමාජ හා සමාජ මානව විද්‍යාඥයින්ගේ මතවාද | • ''සමාජ පරිණාමය'' යන්න ප්‍රාථමික හා නූතන සමාජ ඇසුරින් හඳුනාගනී.<br>• ප්‍රාථමික සමාජයේ ගති ස්වභාවය තමා ජීවත්වන සමාජයේ නවීන හා නවතාවයෙන් යුත් ලක්ෂණ වෙන වෙනම හඳුනාගෙන සාකච්ඡා කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී සාමාජිකයා විසින් අත්දකින නවීනත්වය හා තාක්ෂණික දියුණුව සමාජීය සාක්ෂි ඇසුරින් හඳුනා ගෙන විස්තර කරයි.<br>• සමාජ පරිණාමය යන්න ප්‍රාථමික හා නූතන සමාජ ඇසුරින් ගවේෂණය කොට තොරතුරු එක්රැස් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.2 සමාජ හා මානව විද්‍යාඥයන්ගේ මතවාද ඇසුරින් සමාජ වෙනස්වීම හඳුනා ගනියි. | • ප්‍රාථමික සමාජයේ හා නූතන සමාජවල ඇති ස්වභාවය. | • විවිධ සමාජ හා සමාජ මානව විද්‍යාඥයන් ''සමාජ පරිණාමය'' හඳුන්වා දී ඇති ආකාරය පිළිබඳ හඳුනාගනී.<br>• සාමාජිකයාගේ ජීවිතය කෙරෙහි බලපාන සමාජ වෙනස්වීම විස්තර කරයි.<br>• සාමාජිකයාගේ ජීවිතයට සමාජ පරිණාමය බලපාන ආකාරය අවබෝධ කර ගනී.<br>• සියලු සමාජ නිරතුරුවම වෙනස් වන බව හේතු සාධක සහිතව ප්‍රකාශ කරයි. | 04 |
| | 2.3 බුදුදහම අනුව සියල්ල වෙනස් වන බවත් ඒ අනුව සමාජය වෙනස් වන අයුරුත් පෙන්වා දෙයි. | • සමාජ පරිණාමය සිදුවන ආකාරය බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් අවබෝධ කර ගැනීම. | • සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් දැනගෙන කියයි.<br>• වෙනස් වීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අවබෝධයෙන් ප්‍රකාශ කරයි.<br>• අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් සමාජ පරිණාමය සිදුවන ආකාරය පැහැදිලි කරයි.<br>• සමාජයේ කොටස් කරුවෙකු ලෙස සාමාජිකයාගේ යහ පැවැත්මේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.4 පිරිවෙණ / පන්සල ඇසුරේ සමාජය වෙනස් වූ අයුරු විස්තර කරයි. | • විහාරස්ථානය/ පිරිවෙණ ආශ්‍රයෙන් සිදු වූ සමාජ වෙනස්වීම. | • පැරණි ලාංකික අධ්‍යාපන රටාව පිළිබඳ අධ්‍යයනය කරමින් විහාරස්ථානය මගින් සමාජයට සැලසූ සේවාවන් සඳහන් කරයි.<br>• පිරිවෙණ ඇසුරින් මුල් පෙළ නායකයන් පවා ගොඩනැගුණු ආකාරය හා ඔවුන්ගෙන් සමාජයට වූ සේවාවන් ප්‍රකාශ කරයි.<br>• පිරිවෙණ / විහාරස්ථානය මගින් සිදු වූ සේවාව උදාහරණ මගින් විස්තර කරයි.<br>• විහාරස්ථානය හා පිරිවෙණ ඇසුරේ ශික්ෂාකාමී උගතෙකු බිහි වන බව තර්කානුකූලව ප්‍රකාශ කරයි. | 04 |
| 03. සංස්කෘතිය යන්න හඳුනා ගනියි. | 3.1 සංස්කෘතිය යනු කුමක් දැයි පැහැදිලි කරයි. | • සංස්කෘතිය අර්ථ දැක්වීම. | • නිර්වචන ඇසුරින් සංස්කෘතිය යන්න පැහැදිලි කරයි.<br>• සංස්කෘතිය සමාජ උරුමයක් වන බවත්, සමාජය සංස්කෘතියට අනුව හැඩ ගැසෙන බවත්, අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>• එදිනෙදා භාවිතවන ආම්පන්න ඇසුරින් සංස්කෘතිය හඳුනාගෙන විස්තර කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 3.2 සාමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති සබඳතාව පැහැදිලි කරයි. | • සංස්කෘතිය හා සමාජානුයෝජනය අතර සම්බන්ධය විස්තර කිරීම. | • සමාජානුයෝජනය යන්න අර්ථ දක්වයි.<br>• මානව චර්යාව හා සංස්කෘතිය අතර සම්බන්ධය අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>• සමාජානුයෝජන කාරක නම්කර ඒවායේ කාර්යභාරය ප්‍රකාශ කරයි.<br>• පෞරුෂ වර්ධනය සඳහා සමාජානුයෝජන ක්‍රියාවලිය දායක වන ආකාරය පැහැදිලි කරයි. | 02 |
| | 3.3 බුදුදහමින් අපට අගනා සංස්කෘතියක් දායාදකර ඇති අයුරු පෙන්වා දෙයි. | • බුදුදහමින් දායාද වූ ගති ලක්ෂණ මත ගොඩනැගුණු ශ්‍රී ලාංකේය සංස්කෘතිය හඳුනා ගැනීම. | • බුදුදහම පැමිණීමත් සමඟ ප්‍රාථමික සිංහල සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය බවට පත් වූ ආකාරය අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>• සිංහල සංස්කෘතියෙන් පිළිබිඹු වන බෞද්ධ ලක්ෂණ හඳුනාගෙන පෙන්වා දෙයි.<br>• ප්‍රාථමික සමාජයේ ඇතැම් ඇදහිලි බෞද්ධ ඉගැන්වීම් හේතුවෙන් වෙනස් වූ අයුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සිංහල බෞද්ධ සංස්කෘතයෙහි අන්තර්ගත පරාර්ථකාමී බව හා සහජීවනය හුරු කරගෙන පන්ති කාමරයේ දී ඒවා ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 3.4 ශ්‍රී ලංකාවේ පවතින අනෙකුත් සංස්කෘති පිළිබඳ සරල ව අධ්‍යයනය කරයි. | • ශ්‍රී ලාංකේය සමාජයේ පවතින අනෙකුත් සංස්කෘතිවල මූලික ලක්ෂණ හඳුනාගෙන සංස්කෘතික සහජීවනයක අගය වටහා ගැනීම. | • වාර්ගික විෂමතාවේ පදනම සංස්කෘතිය බව පෙන්වා දෙයි.<br>• ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් බව අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි.<br>• අන්‍ය සංස්කෘතිවල ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සහජීවනයේ වටිනාකම හඳුනාගෙන අනෙකුත් සංස්කෘතිවලට ගරු කරයි. | 02 |
| 04. පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතා හඳුනා ගැනීම. | 4.1 සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධය පිළිබඳ තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි. | • පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධතාව විස්තර කිරීම. | • පුද්ගලයා හා සාමාජිකයා අතර වෙනස වටහා ගනියි.<br>• සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධතාවය හඳුනා ගෙන කටයුතු කරයි.<br>• සමාජානුයෝජනය ඔස්සේ පුද්ගලයා සමාජීය සත්වයෙකු ලෙස ජීවත් වීමට අවැසි ගුණාංග වර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 4.2 සමාජය යනු කුමක්දැයි හඳුන්වා දෙයි. | • සමාජය හඳුන්වා දීම. | • ''සමාජය'' යන්න නිර්වචනය කරයි.<br>• සමාජ වර්ගීකරණය හඳුනාගෙන එහි ලක්ෂණ විස්තර කරයි.<br>• ඒ ඒ සමාජවල ඇති සංස්කෘතික වටිනාකම් ඇගයීමට ලක් කරයි. | 02 |
| | 4.3 සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය අධ්‍යයනය කරයි. | • සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය වටහා ගැනීම. | • සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය හඳුනා ගනියි.<br>• විවිධ ආයතනවලින් ඉටුවන කාර්යභාරය විස්තර කරයි.<br>• සමාජ විවිධත්වය හා සමාජ සංකීර්ණත්වය හඳුනාගෙන ඒ අනුව කටයුතු කරයි. | 02 |
| | 4.4 බුදු දහමට අනුව සමාජ සබඳතා වර්ධනය කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි. | • බුදු දහම සමාජ සබඳතා ගැන දක්වන ආකල්ප හඳුන්වා දීම. | • සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ දී බුදු දහමේ සඳහන් සූත්‍ර ධර්ම ඉවහල් කර ගත හැකි අයුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා බෞද්ධ ධර්ම මාර්ගයෙහි පිහිටා කටයුතු කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 05. සමාජයේ යහපැවැත්ම උදෙසා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් ඒ සඳහා දායකත්වය සපයයි. | 5.1 සමාජ පාලනයෙහි අවශ්‍යතාව අවබෝධ කර ගනියි. | • සමාජ පාලනයේ අවශ්‍යතාව හඳුනා ගැනීම.<br>• සමාජ පාලනයෙහි චාරිත්‍ර/වාරිත්‍රවල වැදගත්කම විස්තර කිරීම.<br>• සාරධර්ම හා සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පැහැදිලි කිරීම. | • ''සමාජ පාලනය'' යන්න අර්ථ දක්වයි.<br>• සමාජ පාලනයෙහි අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• සමාජ පාලනය සඳහා දායකත්වය සැපයීමෙන් අත්වන ප්‍රයෝජන පෙන්වා දෙයි. | 02 |
| | 5.2 අවිධිමත් හා විධිමත් සමාජ පාලනය සිදුවන ආකාරය විමර්ශනය කරයි. | • සමාජ පාලනයෙහිලා බුදුදහමේ දැක්වෙන භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය හඳුන්වාදීම.<br>• විධිමත් හා අවිධිමත් සමාජ පාලනය අගය කිරීම. | • විධිමත් හා අවිධිමත් සමාජ පාලනය බෙදා දක්වයි.<br>• අවිධිමත් සමාජ පාලන කාරක යටතේ සිරිත් විරිත්, ධර්මතා, විශ්වාස, සම්ප්‍රදායන් හා සාරධර්ම යන කරුණු උදාහරණ මගින් පැහැදිලි කරයි.<br>• චාරිත්‍ර වාරිත්‍ර සමාජය තුළ පිළිගැනීමේ හා ක්‍රියාත්මක වීමේ ස්වභාවය අනුව වර්ගකර දක්වයි.<br>• ව්‍යවස්ථාපිත නීතිය යනු කුමක් දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 5.3 පිරිවෙණ හා පන්සල මගින් අවට සමාජයේ සමාජ පාලනය උදෙසා කරනු ලබන කාර්යභාරය ගවේෂණය කරයි. | • පන්සල හා පිරිවෙණ ආශ්‍රිත සමාජ පාලනය වටහා ගැනීම. | • පිරිවෙණ හා පන්සල සමාජයේ යහ පැවැත්ම සඳහා ක්‍රියාකරන ආකාරය පෙන්වා දෙයි.<br>• බුද්ධ කාලීන සමාජයේ පැවති සමාජ පාලන උපක්‍රම විස්තර කරයි.<br>• යහපත් පැවැත්ම සඳහා හේතුවන බෞද්ධ ඉගැන්වීම් පෙන්වා දෙයි.<br>• සමාජ පාලනයෙහිලා භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන කාර්යභාරය පැහැදිලි කරයි.<br>• එහිලා තමන්ට ද වගකීමක් භාර වන බව අවබෝධ කරයි. | 04 |
| 06. සමාජ ගැටලු හඳුනා ගනියි. | 6.1 සමාජ ගැටලුවක් යන්න හඳුනා ගනී. | • සමාජ ගැටලු හැඳින්වීම. (මදිරාබාධය, කසල කළමණාකරණ ඌණතා ගැටලුව, දුප්පත්කම, වකුගඩු රෝගය, ළමා අපයෝජනය) | • 'සමාජ ගැටලු' යන්න අර්ථ දක්වයි.<br>• සමාජ ගැටලු හඳුනා ගෙන නම් කරයි.<br>• සමාජ ගැටලු වර්ගීකරණය කර දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 6.2 සමාජ ගැටලු වර්ගීකරණය කර ඒවාට බලපාන හේතු පැහැදිලි කරයි. | • සමාජ ගැටලු ඇතිවීමට බලපාන හේතු වටහා ගැනීම. | • සමාජ ගැටලු හඳුනා ගෙන ඒවා ඇතිවීමට බලපාන හේතු වෙන් කර දක්වයි.<br>• එම ගැටලු විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | 02 |
| | 6.3 සමාජ ගැටලුවලින් සමාජයට වන බලපෑම ගවේෂණය කරයි. | • සමාජ ගැටලුවලින් සමාජයට සිදුවන බලපෑම හඳුනා ගැනීම. | • සමාජ ගැටලුවලින් සමාජයට සිදු වන බලපෑම පැහැදිලි කරයි.<br>• සමාජ ගැටලු වළක්වා ගැනීමට ක්‍රියා කළ හැකි බව ප්‍රකාශ කරයි. | 02 |
| | 6.4 සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් භාවිත කරයි. | • සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් විස්තර කිරීම. | • සමාජ ගැටලු වළක්වා ගැනීමට අවශ්‍ය බෞද්ධ ඉගැන්වීම් හඳුනා ගනියි.<br>• සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් භාවිත කරයි.<br>• සමාජ ගැටලු නිරාකරණයෙහි ලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව අගය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 07. සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගනියි. | 7.1 සරල සමාජවිද්‍යා පර්යේෂණ යනු කුමක් දැයි හඳුනා ගනියි. | • සරල සමාජවිද්‍යා පර්යේෂණයක් යනු කුමක් දැයි විමසා ගැනීම. | • නිර්වචන ඇසුරින් පර්යේෂණයක් යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• තොරතුරු ගවේෂණය සඳහා පර්යේෂණවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාවේ ප්‍රධාන උප විෂයක් ලෙස පර්යේෂණ ක්‍රම පැහැදිලි කරයි. | 01 |
| | 7.2 ගැටලු විසඳීම සඳහා පර්යේෂණවල වැදගත්කම අවබෝධ කර ගනියි. | • සමාජ ගැටලු විසඳීමෙන් ලැබෙන ප්‍රතිලාභ හඳුනා ගැනීම. | • පර්යේෂණවල ඇති වැදගත්කම පැහැදිලි කරයි.<br>• ගැටලු නිරාකරණය කිරීම සඳහා පර්යේෂණවලින් ලබා ගන්නා තොරතුරු වැදගත් බව අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• පර්යේෂණයකින් ලබා ගන්නා තොරතුරුවල සත්‍ය අසත්‍යතාව විශ්ලේෂණය කර සමාජ ප්‍රයෝජනය සඳහා ලබා ගන්නා ආකාරය උදාහරණ සහිතව පෙන්වා දෙයි.<br>• පර්යේෂණ මාර්ගයෙන් ලබා ගන්නා තොරතුරු ගැටළු නිරාකරණය කර ගැනීමට යොදා ගත හැකි බව අවබෝධ කර ගෙන පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.3 සරල සමාජ විද්‍යා පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කළයුතු පියවර පැහැදිලි කරයි. | • සමාජ විද්‍යා පර්යේෂණවල පියවර පැහැදිලි කිරීම. | • පර්යේෂණයක පියවර නිවැරදිව පෙළ ගස්වයි.<br>• පර්යේෂණයකින් ලබා ගන්නා තොරතුරු සමාජ ප්‍රගමනයට යොදා ගන්නා ආකාරය පැහැදිලි කරයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 01. සමාජ විද්‍යාව හැඳින්වීම

**නිපුණතාව -** සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී.

**නිපුණතා මට්ටම් -** 1.1 සමාජ විද්‍යාවේ බිහිවීම හා වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි.

1.2 සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජනවල වැදගත්කම අගය කරයි.

1.3 සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුනාගෙන විස්තර කරයි.

1.4 සමාජ ගැටලු විශ්ලේෂණයේ දී හා නිවාරණයේ දී බුදු දහම ප්‍රශස්ත බව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 08 යි.**

**හැඳින්වීම**

මානව සමාජය පිළිබඳ විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබන විෂය සමාජ විද්‍යාව වේ. ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව යන විෂයයන් සමාජීය විද්‍යා ඝනයට අයත් වන බව අර්ථ කථනය කර ඇත. දහනව වන සියවසේ දී යුරෝපීය සමාජය කේන්ද්‍ර කර ගෙන ආරම්භ කරන්නට යෙදුන සමාජ විද්‍යාව කෙටි ඉතිහාසයක් ඇති සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට අයත් නැවුම් විෂයයකි. සමාජ යථාර්ථය හෙළිකර ගැනීම සඳහා පර්යේෂණාත්මකව විද්‍යාත්මක නිගමනවලට එළඹීම සමාජ විද්‍යාඥයාගේ කාර්යය වේ.

සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පියවරෙන් පියවර වර්ධනය වී ඇත. ඒ අනුව පහත මාතෘකා ඔස්සේ විෂය දැනුම ප්‍රගුණ කර ගත හැකි ය. එනම් සමාජ විද්‍යාවේ ආරම්භය හා විකාශනය, අරමුණු හා ප්‍රයෝජන, සංකල්ප හා විෂය ක්ෂේත්‍රය සහ බෞද්ධ ඉගැන්වීම පිළිබඳ සමාජ විද්‍යාව වශයෙනි. එම විෂය ක්ෂේත්‍රය යටතේ සමාජ සංස්ථා, සමාජානුයෝජනය, සමාජ සමූහ, තත්ත්වය හා කාර්යභාරය, සංස්කෘතිය හා සමාජ වෙනස්වීම ආදි සංකල්ප කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යයනය කළ හැකි ය. මේ සියලු සංකල්ප හා විෂය දැනුම උපයෝගී කරගෙන බෞද්ධ භික්ෂූන් වහන්සේට සමාජයට නායකත්වය ලබා දීමට හැකි වන්නේ කුමන ආකාරයෙන් ද යන්න අධ්‍යයනය කළ හැකි ය.

**නිපුණතාව -** සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී.

**නිපුණතා මට්ටම -** 1.1 සමාජ විද්‍යාවේ බිහිවීම හා වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. දහනව වන සියවසේ සමාජ විද්‍යාවේ බිහිවීම හා විෂය වර්ධනය වූ ආකාරය පැහැදිලි කරයි.
2. සමාජ විද්‍යාවේ ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරයි.
3. සමාජ විද්‍යාවේ බිහිවීම සමාජමය අවශ්‍යතාවක් බව පෙන්වා දෙයි.
4. සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් හඳුනාගෙන ඔවුන්ගේ මතවාද අධ්‍යයනය කරයි.

හැඳින්වීම - Socius යන ලතින් වචනය හා Logos යන ග්‍රීක වචනය එකතුවීමෙන් Sociology යන පදය සැකසී ඇත. Socius යන ලතින් වචනයෙන් මිත්‍රත්වය ද Logos යන ග්‍රීක වචනයෙන් අධ්‍යයනය කිරීම යන්න ද අර්ථ දක්වා ඇත. සමාජ, ආර්ථික, ආගමික හා දේශපාලන සාධක හේතු කොට ගෙන 19 වන සියවසේ දී සමාජ විද්‍යා විෂය බිහි වී ඇත.

ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු වූ ඔගස්ට් කොම්ට් සමාජ විද්‍යාව නම් විෂය බිහි කිරීමට මූලික වූ තැනැත්තා ලෙස ඉතිහාස ගත වේ. මේ ආකාරයට සමාජ විද්‍යාව හඳුන්වා දීමෙන් අනතුරුව එහි වර්ධනය සඳහා දායකත්වය දෙන ලද තවත් විද්‍යාඥයින් කිහිප දෙනෙක් පිළිඳව සඳහන් වේ. ඒ අතරින් එමිල් ඩුර්කයිම්, මැක්ස් වේබර්, හර්බට් ස්පෙන්සර්, කාල් මාක්ස්, ටැල්කොට් පාර්සන්ස් යන අය ප්‍රධාන වේ. මොවුන් විසින් ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක මතවාද සමාජ විද්‍යාව වඩාත් ජනප්‍රිය වීමට හේතු වී තිබේ.

සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන් අතර රැජිණ ලෙස ප්‍රංශ ජාතික ඔගස්ට් කොම්ට් (1798 - 1857) විසින් හඳුන්වන ලදි. එම විෂය ස්වාධීන විෂයයක් ලෙස වර්ධනය කිරීමට එමිල් ඩුර්කයිම් (1858 - 1917) හා මැක්ස් වේබර් (1864- 1920) යන අය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළහ. සම්භාව්‍ය සමාජ විද්‍යාඥයෙකු වශයෙන් හර්බට් ස්පෙන්සර් (1820 - 1903) ද හැඳින්විය හැකිය. ඔහු පරිණාමවාදී අදහස් දැක් වූ අයෙකි. ''සමාජය සත්ත්ව ශරීරයට සමානය'' යන මතය ඉදිරිපත් කළ මුල් කාලීන සමාජ විද්‍යාඥයකු ලෙස ඔහු ප්‍රකට ය. මෙහි දී කාල් මාක්ස් (1818 - 1883) ද සමාජ විද්‍යාවේ සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් දැක් වූ අයෙකි. තමා උපත ලැබූ සමාජය ද විවේචනය කළ සමාජවාදියෙක් ලෙස මාක්ස් ප්‍රකටය. ඔහු ගේ මතවාදයට අනුව ග්‍රීක හා රෝම සමාජවල වහලා හා වහල් හිමියා අතරත්, මධ්‍ය කාලීන වැඩවසම් සමාජයේ රදළයා හා ප්‍රවේනිදාසයා අතරත් ගැටුමක් පැවතියේ ය. එසේම ධනවාදී සමාජයේ ධනපතියා හා කම්කරුවා අතරත් ගැටුම් උද්ගත වන බව තව දුරටත් ඔහු පෙන්වා දෙයි.

නිෂ්පාදන සම්පත් හිමි පන්තිය ධනේශ්වර පන්තිය ලෙසත්, නිෂ්පාදන ක්‍රියාවලියට වුවමනා ශ්‍රමය සපයන පිරිස කම්කරු පන්තිය ලෙසත් බෙදී ඇති බව මාක්ස් අවධාරණය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* ප්‍රදර්ශනය
* ඉදිරිපත් කිරීම්
* දේශන

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යා විෂය බිහිවීමේ වැදගත්කම අධ්‍යයනය කරයි.
2. සමාජ විද්‍යාව ඉගෙන ගැනීම සමාජ ගැටලු හඳුනා ගැනීමටත්, ඒ සඳහා විසඳුම් සෙවීමටත් මහත් උපකාරයක් බව පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* ඔගස්ට් කොම්ට්ගේ ඡායාරූපයක් (ඇමුණුම් 01)
* සංකල්ප සිතියම (ඇමුණුම් 02)
* එමිල් ඩුර්කයිම්, මැක්ස් වේබර්, ඔගස්ට් කොම්ට්, හර්බට් ස්පෙන්සර්, කාල් මාක්ස් යන අයගේ නම් ලියන ලද පත්‍රිකා සිසුන් සංඛ්‍යාව අනුව
* තොරතුරු විස්තර පත්‍රිකාව (ඇමුණුම් 04)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

සමාජ විද්‍යා විෂය බිහිකිරීමට මූලිකව ක්‍රියා කළ දාර්ශනිකයා වන ඔගස්ට් කොම්ට්ගේ ඡායාරූපය ප්‍රදර්ශනය කර, ඔහු පිළිබඳ හඳුන්වා දෙමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම් 01)

* සමාජ විද්‍යාවේ බිහිවීම කෙරෙහි බලපෑ 19 වන සියවසේ බටහිර සමාජ පසුබිම පිළිබඳ පැහැදිලි කරන්න. ඒ යටතේ පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
    - » ආගමික පුනරුදය
    - » කාර්මික විප්ලවය
    - » දේශපාලන ප්‍රතිසංස්කරණ
* තව දුරටත් ඉහත කරුණු තහවුරු කිරීම සඳහා සංකල්ප සිතියම යොදා ගන්න. (ඇමුණුම් 02)
* ප්‍රායෝගිකව සමාජ විද්‍යා විෂය තම ජීවිතයට වැදගත් වන අයුරු සනාථ කරන්න.
* 19 වන සියවස වන විට පැවැති සමාජ අවශ්‍යතාවක් ලෙස ඔගස්ට් කොම්ට් විසින් සමාජ විද්‍යා විෂය හඳුන්වා දුන් බව පෙන්වා දෙන්න. ඒ යටතේ පහත කරුණු ගැන අවධානය යොමු කරන්න.
* එවකට පැවැති අනෙකුත් සමාජීය විද්‍යාවන්ට සමාජ හැසිරීම විද්‍යාත්මකව විග්‍රහ කිරීමට නොහැකි වූ නිසා එම කාර්යය සඳහා සමාජ විද්‍යාව බිහි වී වැඩි දියුණු වූ බව පෙන්වා දෙන්න. (ආර්ථිකය පිළිබඳව ආර්ථික විද්‍යාවත්, දේශපාලනය පිළිබඳ දේශපාලන විද්‍යාවත්, වශයෙන් එක් ක්ෂේත්‍රයක් පමණක් එක් එක් විෂය යටතේ අධ්‍යයන කිරීම).

* ඔගස්ට් කොම්ට්ගෙන් පසුව සමාජ විද්‍යාවේ වර්ධනයට ක්‍රියා කළ පහත සඳහන් විද්‍යාඥයින් පිළිබඳ සාකච්ඡා කරන්න.

    » එමිල් ඩූර්කයිම්

    » හර්බට් ස්පෙන්සර්

    » මැක්ස් වේබර්

    » කාල් මාක්ස්

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විද්‍යා විෂය බිහිවීමට බලපෑ කරුණු ගැන සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (ආගමික පුනරුදය, කාර්මික විප්ලවය, දේශපාලන ප්‍රතිසංස්කරණ) | සාකච්ඡා ක්‍රමය |
| සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින්ගේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ප්‍රායෝගික ජීවිතයට ලබා ගත හැකි ප්‍රයෝජන පිළිබඳ කරුණු පැහැදිලි කරන්න. | දේශන ක්‍රමය |
| සමාජ විද්‍යා විෂය වර්ධනය සඳහා කටයුතු කළ මුල් කාලීන විද්‍යාඥයින්ගේ තොරතුරු හා මතවාද පිළිබඳව සිසුන් දැනුවත් කර එම තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. | සාකච්ඡා ක්‍රමය<br>ඉදිරිපත් කිරීම |

**ඇගයීම හා තක්සේරුකරණය**


* සමාජ විද්‍යා විෂය සංවර්ධනය සඳහා ක්‍රියා කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් පස් දෙනා පිළිබඳ කරුණු එක්රැස් කිරීමට සුදුසු ක්‍රියාකාරකමකට සිසුන් යොමු කරන්න. (මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න).
* ඇමුණුම් 03හි සඳහන් පත්‍රිකාව පංතියේ ප්‍රදර්ශනය කරන්න.
* එම පත්‍රිකාවේ සඳහන් වන්නේ සමාජ විද්‍යා විෂය සංවර්ධනය සඳහා දායක වූ විද්‍යාඥයින්ගේ න්‍යායන් හා තොරතුරු බව දැනුවත් කරන්න.
* අදාළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයාට ගැලපෙන තොරතුරු නිවැරදිව තෝරා ගෙන ලබා දී ඇති පත්‍රිකාවේ (ඇමිණුම් 4) ලියා දක්වන්නට අවස්ථාව සලසන්න.
* අදාළ පිළිතුරු පත්‍ර අධික්ෂණය කිරීමෙන් පසු, සිසුන් ලවා පංතියට ඉදිරිපත් කරවන්න.
* පිළිතුරු තුනම නිවැරදි නම් ලකුණු (4X3 = 12) ක් ලබා දෙන්න.
* පිළිතුරු 2ක් නිවැරදි නම් ලකුණු 8 යි.
* එක් නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 4 කි.
* නිවැරදි පිළිතුරු අගයන්න.

ඇමුණුම 1



ඔගස්ට් කොම්ට්

ඇමුණුම 2




ඇමුණුම 3

**සමාජ විද්‍යාඥයින්ගේ න්‍යායන් හා තොරතුරු**

01. තම උපන් රටේ පැවැති සමාජ ක්‍රමය දැඩි ලෙස විවේචනය කළ විද්‍යාඥයෙකි.

02. ප්‍රාථමික හා නූතන සමාජ අතර වෙනස ශ්‍රම විභජනය මත පදනම්ව ඇති ආකාරය විග්‍රහ කරයි.

03. සමාජය ඓන්ද්‍රිය පද්ධතියකට උපමා කර ඇත.

04. පන්ති අතර ගැටුමක් පවතින බව ප්‍රකාශ කරයි.

05. ආගම, පන්තිය, නිලබල ක්‍රමය වැනි සංකල්ප සමාජ විද්‍යාත්මක කෝණයකින් අධ්‍යයනය කිරීමට උත්සාහ කළේය.

06. සමාජ විද්‍යාව මගින් සමාජ ක්‍රියාව අධ්‍යයනය කළ යුතු බව පැවැසීය.

07. සමාජ විද්‍යාව මගින් සමාජ පැවැත්ම හා සමාජ වෙනස්වීම අධ්‍යයනය කළ යුතු ය.

08. සමාජයේ පැවැත්මට පවුල, ආර්ථිකය, විවාහය සහ ආගම යන සංස්ථාවන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය බව පැවැසීය.

09. ''සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතින්'' කෘතියේ කර්තෘවරයා ය.

10. ප්‍රංශ ජාතිකයෙකි.

11. ජර්මන් ජාතිකයෙකි.

12. බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.

13. සමාජ විද්‍යාවේ ආරම්භකයා ය.

14. සමාජය දෙවියන්ගේ නිර්මාණයක් නොව මිනිසාගේ ම නිර්මාණයක් බව පැවසූහ.

ඇමුණුම 4

| ඔගස්ට් කොම්ට් | එමිල් ඩුර්කයිම් | මැක්ස් වේබර් | හර්බට් ස්පෙන්සර් | කාල් මාක්ස් |
|---|---|---|---|---|
| | | | | |

**නිපුණතාව -** සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී.

**නිපුණතා මට්ටම -** 1.2 සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජනවල වැදගත්කම අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාවේ අරමුණ හා ප්‍රයෝජනවල වැදගත්කම අගයමින් අදහස් දක්වයි.
2. සමාජ විද්‍යාවේ ප්‍රධාන තේමාවන් නම් කරයි.
3. සමාජ වෙනස්වීමට බලපාන සංකල්ප ප්‍රකාශ කරයි.
4. සමාජ ප්‍රශ්න පැහැදිලි කරයි.
5. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන ඉදිරිපත් කරයි.

**හැඳින්වීම -** අන්තර් මානුෂික සම්බන්ධතා හැදෑරීම සමාජ විද්‍යාවේ ප්‍රධාන අරමුණ වෙයි. විවිධ සමාජ විද්‍යාඥයින් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇතත් ඒ සියල්ල ප්‍රධාන අරමුණ තුළ අඩංගුව ඇත. සාමාජිකයා, සමාජ සමූහ හා සමග සම්බන්ධ වෙමින් කරනු ලබන ක්‍රියා හා ප්‍රතික්‍රියා විග්‍රහ කරමින් මානව හැසිරීම විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාවේ මූලික අරමුණ වන්නේ ය.

එමෙන් ම සමාජ වෙනස්වීම යටතේ ලබා දෙන නාගරීකරණය, නවීකරණය, කාර්මීකරණය, බටහිරකරණය හා ගෝලීයකරණය ආදි ප්‍රවාහයන් පිළිබඳ අවබෝධය ද සමාජ ජීවිතයට ප්‍රයෝජනවත් වේ. ග්‍රාමීය ජනතාව නගර කරා සංක්‍රමණය වීම හේතුවෙන් නගරයේ භූගෝලීය සීමා පුළුල් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස නාගරික ලක්ෂණ ව්‍යාප්ත වී නාගරීකරණය වේගවත් වේ. නවීකරණය ද සමාජ වෙනස්වීමේ කාරකයකි. බටහිර රටවලට ගැති වී හෝ නොවී හෝ කලට හා තැනට අනුව ඇතිවන වෙනස්වීම නවීකරණය නම් වේ. දියුණු විද්‍යාත්මක ක්‍රම පමණක් නොව සමාජ, ආර්ථික, දේශපාලන, ප්‍රවාහන, ජනමාධ්‍ය, අධ්‍යාපන යන සෑම ක්ෂේත්‍රයක්ම නවීකරණය යටතේ අධ්‍යයනය කරනු ඇත.

කාර්මීකරණය ද සමාජ වෙනස්වීමේ කාරක ගණයට අයත් වේ. මිනිස් ශ්‍රමය හා සත්ව ශ්‍රමය වෙනුවට යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කිරීම වඩාත් ලාභදායි මෙන්ම කාර්යක්ෂම බව කාර්මීකරණය මගින් තහවුරු කර ඇත. ඒ අනුව නිෂ්පාදන හා සේවා කටයුතු මෙමගින් වේගවත් කළ හැකි වේ. විශ්ව ගම්මාන සංකල්පය ගෝලීයකරණය යටතේ අධ්‍යයනය කෙරේ. ධනාත්මක මෙන් ම ඍණාත්මක ප්‍රතිඵල ද ගෝලීයකරණය නිසා ලෝකයට අත් විඳීමට සිදුව ඇත.

සමාජ ජීවිතයේ විවිධත්වය යථා පරිදි අවබෝධ කර ගැනීමටත් සමාජ ගැටලු විශ්ලේෂණයට හා විසඳුම් කරා අවතීර්ණ වීමටත් උපකාරි වීම සමාජ විද්‍යාවෙන් ලද හැකි ප්‍රයෝජන වශයෙන් දැක්විය හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ඉදිරිපත් කිරීම්
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ස්ථිතිකත්වය (පැවැත්ම) හා ගතිකත්වය (වෙනස්වීම) හඳුනා ගනියි.

2. සමාජයක් විසංවිධානයට හේතුවන සමාජ ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීමට සමාජ විද්‍යාත්මක දැනුම උපයෝගී කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇතුළත් කාඩ්පත (ඇමුණුම් 01)
- පෑන්, කොල, පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

පිවිසීම : සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇතුළත් කාඩ්පත ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසීම.

- සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමත්, සමාජ සබඳතා පදනම්ව ගොඩනැගෙන සමාජ සංස්ථා, සමාජ සංවිධාන හා සංස්කෘතිය අධ්‍යයනය කිරීමත් සමාජ විද්‍යාවේ ප්‍රධාන අරමුණ බව පැහැදිලි කරන්න.
- සමාජ විද්‍යාවේ ප්‍රධාන තේමා දෙකකි. එනම්,
  - » සමාජ ස්ථිතිකත්වය
  - » සමාජ ගතිකත්වය පැහැදිලි කරන්න.
- සමාජ වෙනස්වීම යටතේ පහත සඳහන් කාරක පිළිබඳ හැඳින්වීමක් කරන්න.
  - » නාගරීකරණය
  - » නවීකරණය
  - » කාර්මීකරණය
  - » බටහිරකරණය
  - » ගෝලීයකරණය
- තමා ජීවත්වන සමාජය හා වෙනත් සමාජ පිළිබඳ තේරුම් ගැනීමට සමාජ විද්‍යා දැනුම ප්‍රයෝජනවත් වන බව පැහැදිලි කර දෙන්න.
- යුගයෙන් යුගයට සමාජය වෙනස්වන අයුරු සාකච්ඡා කරන්න.
- සමාජ ගැටලු හඳුන්වා දෙන්න.
- සමාජය දෙස පුළුල් දෘෂ්ටිකෝණයකින් බැලීමට සමාජ විද්‍යාත්මක දැනුම ප්‍රයෝජනවත් වන අයුරු පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජන කීපයක් පිළිබඳ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ස්ථිකත්වය හා ගතිකත්වය පිළිබඳ පැහැදිලි කර දෙන්න. | දේශන ක්‍රමය |
| සමාජ වෙනස්වීම බුදු දහමට අනුව පැහැදිලි කරන්න. | දේශන ක්‍රමය |
| සමාජ විද්‍යාව ඉගෙනීමෙන් භික්ෂූන් වහන්සේට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සාකච්ඡා කර එම ප්‍රයෝජන කීපයක් පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න. | ඉදිරිපත් කිරීම |
| සමාජ ගැටලු සරල ලෙස හඳුන්වා දෙන්න. | දේශන ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- සමාජ වෙනස්වීමට හේතු වන සමාජ විද්‍යාත්මක කාරක දෙකක් ලියන්න.
- සමාජ විද්‍යාවේ ප්‍රධාන තේමා දෙක නම් කරන්න.
- භික්ෂුවක් වශයෙන් සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න.
- සමාජ ගැටලු 04ක් නම් කරන්න.
  - » නිවැරදි පිළිතුරු අධීක්ෂණය කර එක නිවැරදි පිළිතුරකට ලකුණු 04 බැගින් ප්‍රදානය කරන්න. (4x4 =16)
  - » ඇගයීම් සහ ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
  - » ලිඛිත හා වාචික පිළිතුරු අදාළ වේ.

**ඇමුණුම 01**

- සමාජ ජීවිතය පිළිබඳ යථා පරිදි අවබෝධ කර ගැනීමට හැකිවීම.
- සමාජමය කාර්යයන් සැලසුම්කරණය පහසු වීම.
- සමාජ ගැටලු විශ්ලේෂණයට හා විසඳුම් සොයා ගැනීමට උපකාරී වීම.
- මානව අන්තර් ක්‍රියා රටා හඳුනාගැනීමට හැකි වීම.
- සමාජ යථාර්ථය අවබෝධකර ගැනීමට උපකාරී වීම.
- සමාජය පිළිබඳ විද්‍යාත්මකව සොයා බැලීමට ප්‍රයෝජනවත් වීම.
- සමාජ ජීවිතය පහසු වීම.

**නිපුණතාව -** සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී.

**නිපුණතා මට්ටම -** 1.3 සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුනාගෙන විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හඳුනාගෙන ප්‍රකාශ කරයි.
2. සමූහයක ඇති මූලික ලක්ෂණ පෙන්වා දෙයි.
3. සාමාජික එකතුවක් කවර සමූහයකට අයත් වන්නේ දැයි ප්‍රකාශ කරයි.
4. අවට සමාජයේ හමුවන විවිධ සමාජ තත්ත්වයන් නම් කරයි.
5. සමාජ වෙනස්වීම ගවේෂණය කරයි.
6. සමාජානුයෝජන කාරක නම් කරයි.
7. සංස්කෘතිය පැහැදිලි කරයි.

**හැඳින්වීම -** එමිල් ඩුර්කයිම් සමාජ විද්‍යාව උපකොටස් කීපයකට බෙදා දක්වා ඇත.

එනම් : සාමාන්‍ය සමාජ විද්‍යාව

ආගම පිළිබඳ සමාජ විද්‍යාව

අපරාධ පිළිබඳ සමාජ විද්‍යාව

නීතිය පිළිබඳ සමාජ විද්‍යාව

ආර්ථික සමාජ විද්‍යාව ආදිය ඒ අතර වේ.

එමෙන් ම සමාජ විද්‍යාව ප්‍රධාන විෂය ක්ෂේත්‍ර දෙකක් වශයෙන් ද බෙදී ගොස් ඇත.

01. ශුද්ධ සමාජ විද්‍යාව (දැනුම, ගවේෂණය, රැස්කිරීම)

02. ප්‍රායෝගික සමාජ විද්‍යාව (මෙයින් ප්‍රායෝගික සමාජයේ දෛනික ජීවන කටයුතුවලට සමාජ විද්‍යාව යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කෙරේ.)

ඒ අනුව සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය සමස්ත සමාජීය ජීවිතය ආවරණය වන පරිදි ව්‍යාප්තව ඇති බව පැහැදිලි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ✳ සාකච්ඡා ක්‍රමය
- ✳ ප්‍රදර්ශන
- ✳ දේශන

**ආකල්ප හා ඇගයුම්**

1. සාමූහිකව කටයුතු කිරීමට අදිටන් කරයි.
2. සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි.
3. සමාජ වෙනස්වීමේ සාධක අනුව හැඩගැසීමට හුරු වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- ✳ සංකල්ප සිතියම (ඇමුණුම් 01)
- ✳ නිර්වචන ඇතුළත් පුවරුව (ඇමුණුම් 02)
- ✳ මානව පවුලේ රූප සටහන (විස්තෘත පවුල, න්‍යෂ්ඨික පවුල) (ඇමුණුම් 03)
- ✳ ප්‍රශ්නාවලිය (ඇමුණුම් 04)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ සංකල්ප සිතියම ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම 01)
- ✳ සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ පහත කරුණු යටතේ පාඩම මෙහෙයවන්න.
- ✳ සමාජ සංකල්පවල මූලික ලක්ෂණ හඳුන්වා දෙන්න. (සමාජ සංස්ථා පැහැදිලි කරමින්)

- සමාජ සමූහ

  මෙහිදී ප්‍රධාන සමූහ දෙක වන ප්‍රාථමික සමූහ හා ද්විතීයික සමූහ හඳුන්වා දෙන්න.

- තත්ත්වය හා කාර්යභාරය

  ආරෝපිත තත්ත්වය.

  සාධිත තත්ත්වය

- සමාජ වෙනස්වීම

  නාගරිකරණය, කාර්මිකරණය, නවීකරණය, බටහිරකරණය හා ගෝලීයකරණය

- සමාජානුයෝජනය හා සමාජානුයෝජන කාරක

  පවුල, පාසල, සමවයස් කණ්ඩායම්, ජනමාධ්‍ය

- සංස්කෘතිය

  භෞතික සංස්කෘතිය, අභෞතික සංස්කෘතිය

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ සංකල්ප පැහැදිලි කරන්න. (නිර්වචන මගින් පැහැදිලි කිරීම වඩාත් යෝග්‍ය වේ). (ඇමුණුම 02) | සාකච්ඡා ක්‍රමය |
| පවුල් සංස්ථාව, දේශපාලන සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව සහ ආගමික සංස්ථාව, පිළිබඳ අවබෝධය සාකච්ඡා මගින් ලබා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජානුයෝජන කාරක ලෙස පවුල, පාසල, සම වයස් කණ්ඩායම් ජනමාධ්‍ය හඳුන්වා දෙන්න. | දේශන ක්‍රමය |
| සමාජ සමූහ විස්තර කර දෙන්න. | සාකච්ඡා ක්‍රමය |

| | |
|---|---|
| තත්ත්වය හා කාර්යභාරය උදාහරණ සහිතව පැහැදිලි කර දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියා ප්‍රදර්ශනය කරමින් අර්ථ ගන්වන්න. | ප්‍රදර්ශන |

**ඇගයීම හා තක්සේරුකරණය (ඇමුණුම 04)**

- ✳ මෙය කේවල ඇගයීමක් ලෙස කරන්න.
- ✳ ඇමුණුම් 04හි ඇතුළත් ප්‍රශ්න අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (පිළිතුර පරීක්ෂා කර ලකුණු ලබා දෙන්න)

**ඇමුණුම 04**

01. සමාජ සංකල්පයකට උදාහරණයකි ......................................

02. සමාජානුයෝජන කාරකයක් වනුයේ ...................................

03. ආරෝපිත තත්ත්වයට උදාහරණයකි ...................................

04. සාධිත තත්ත්වය යනු ....................................

05. සමාජ වෙනස්වීමේ ලක්ෂණයක් වනුයේ ............................

06. මිනිසා පරපුරෙන් පරපුරට දායාදයක් වශයෙන් ගෙනයන ජීවන රටා සමූදාය ..................................

07. ගම නගරය බවට පත්වීම ....................................


(නාගරිකරණයයි, උත්සාහයෙන් ලගා කර ගැනීමයි, සමාජ සංස්ථා, ජනමාධ්‍ය, සංස්කෘතියයි, කුලය, ගෝලීයකරණයයි)

ක්‍රියාකාරකමට පහළින් ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පිරවීමට උපදෙස් දෙන්න.

**වාචික ඇගයීම් (ඇමුණුම 03)**

- ✳ විස්තෘත පවුලට අයත් සාමාජිකයින් (ඥාතීන්) කවුද?
- ✳ න්‍යෂ්ටික පවුලේ සාමාජිකයින් (ඥාතීන්) කවුද?

ඇමුණුම 01




ඇමුණුම 02

සමාජ සමූහයක් තුළ හෝ සමූහ ගත වීමේ දී හෝ පුද්ගලයා අනෙක් අය සමග කටයුතු කරන පදවිය තත්ත්වය වේ.

(මොරිස් ගින්ස්බර්ග්)

දෙමාපියන් අනුදත් ධර්මතා අභ්‍යන්තරීකරණය කරගෙන දරුවා විසින් සුපහන් සිතක් වර්ධනය කර ගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජය යි.

(ජෝර්ජ් හර්බට් මීඩ්)

මිනිසා පරපුරෙන් පරපුරට දායාදයක් වශයෙන් ගෙනයන ජීවන රටා සමුදාය සංස්කෘතියයි.

(රැල්ෆ් ලින්ටන්)


සමාජ සමූහයක් යනු සාපේක්ෂව ස්ථාවර සමාජ සම්බන්ධතා මගින් එකට ගොනු කළ සාමාජිකයන් දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සැදි සාමාජික එකතුවකි.

අභ්‍යන්තර හා බාහිර බලපෑම් නිසා සමාජ සමූහ, සමාජ ව්‍යුහය ගති හුරු පුරුදු හා බඩු භාණ්ඩ ආදියෙහි නිරීක්ෂණය කළ හැකි අයුරින් ඇතිවන පෙරලිය සමාජ වෙනස් වීම යි.

(ටොම් බාර්න්ස්)


ඇමුණුම 03

න්‍යෂ්ටික පවුල




| | |
|---|---|
| △1 | - පියා |
| ○2 | - මව |
| △3 | - පුතා |
| ○4 | - දුව |

විස්තෘත පවුල




| | |
|---|---|
| △1 | - අත්තා (සීයා) |
| ○2 | - අත්තම්මා (ආච්චි) |
| △3 | - පියා |
| ○4 | - මව |
| △5 | - තමා (පුතා) |
| ○6 | - සහෝදරිය (දුව) |
| ○7 | - නැන්දම්මා |
| △8 | - බාප්පා / ලොකු අප්පා |

**නිපුණතාව -** සමාජ විද්‍යාව පිළිබඳ ඇති විවිධ නිර්වචන අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනී.

**නිපුණතා මට්ටම -** 1.4 සමාජ ගැටලු විශ්ලේෂණයේ දී හා නිවාරණයේ දී බුදු දහම ප්‍රශස්ත බව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. බෞද්ධ භික්ෂුවට සමාජ විද්‍යා දැනුමෙහි ඇති අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
2. ගැටලු විශ්ලේෂණයේ දී හා නිවාරණයේ දී බුදු දහම ප්‍රශස්ත බව පවසයි.
3. නායකත්වය සඳහා සමාජ විද්‍යා දැනුමේ ඇති ප්‍රයෝජන ගෙන හැර දක්වයි.
4. සමාජ ගැටලු නම් කරයි.
5. සංකීර්ණ සමාජයේ විවිධ චරිත හඳුනා ගැනීමට සමාජ විද්‍යාව උපකාරි වන අයුරු ප්‍රකාශ කරයි.

**හැඳින්වීම -** බුද්ධ ශාසනයේ එදත් අදත් මූලික තැනක් ගෙන ඇති භික්ෂූන් වහන්සේගේ ජීවිතය හා කාර්යභාරය සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් වෙයි. බුදු දහම ලංකාවට හඳුන්වා දීමෙන් පසුව ඒ සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලැබෙන අතර භික්ෂූන් වහන්සේ ගිහියාගේ සමාජ ජීවිතය සමග සමීප විය. ඒ අනුව ගිහියාගේ අධ්‍යාපනික, ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලනික කටයුතුවල දී මෙන්ම පවුල් සංස්ථාවේ යහපත පිණිස ද භික්ෂූන් වහන්සේගේ මග පෙන්වීම සාමාන්‍ය තත්ත්වයක් විය. භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර මැනවින් ගොඩනැගුණු අන්තර් සබඳතාව අතීතයේ සිට පැවතෙන්නකි. ගිහි ජනතාවගේ ජීවිතයේ අර්බුධකාරී අවස්ථාවල දී භික්ෂූන් වහන්සේගේ මග පෙන්වීම හා අනුශාසනය පරිදි ක්‍රියා කර එම අර්බුදවලින් මිදීමට හැකි විය. ඒ අනුව සමාජය පිළිබඳ විද්‍යාත්මක දැනුමෙන් යුක්ත සමාජ විද්‍යා විෂය ප්‍රගුණ කිරීම භික්ෂුවගේ සමාජ මෙහෙවර මැනවින් ඉටු කිරීමට මනා පිටුවහලක් වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

✳ සාකච්ඡා ක්‍රමය

✳ ඉදිරිපත් කිරීම්

✳ කණ්ඩායම් ක්‍රමය

✳ ප්‍රදර්ශනය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ අභියෝගවලට මුහුණ දීමේ දී භික්ෂූන් වහන්සේට සමාජ විද්‍යා විෂය දැනුම අවශ්‍ය බව අවබෝධ කර ගනියි.
2. සමාජ ගැටලුවලට මුහුණ දීමේ දී උපේක්ෂා සහගතව කටයුතු කිරීමේ වැදගත්කම පසක් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

✳ ඡායාරූප, පත්‍රිකා, පෑන්, ලිපි එකතුවක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ භික්ෂූන් වහන්සේ නමක් ගිහි පිරිසක් සමග සාකච්ඡා කරන ඡායාරූපයක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම 01) (අනුශාසකත්වය හොබවන අයුරු පැහැදිලි කිරීමට)
- ✳ වගකීම් උසුලන භික්ෂුවක් වශයෙන් කටයුතු කිරීමේ දී සමාජ විද්‍යා දැනුම ලබා දීමට බුදු දහම යොදා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.
- ✳ සමාජ ගැටලු හඳුනා ගෙන එයට විසඳුම් ලබා දීමට බුදු දහම යොදා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.
- ✳ භික්ෂුවට නායකත්වය ලබා ගැනීමට සිදුවන අවස්ථා සිසුන් සමග සාකච්ඡා කරන්න.

උදා : සමත මණ්ඩල, පවුල් ආරවුල් ඇති වූ අවස්ථාවක, සමාජ ගැටලු සහගත අවස්ථාවලදී

- ✳ සමාජ ගැටලු සමාජ විද්‍යාත්මකව හඳුනා ගන්නා අයුරු පහදන්න.
- ✳ ඒවාට විසඳුම් සොයන අයුරු හඳුන්වා දෙන්න.
- ✳ සමාජයේ දක්නට ලැබෙන විවිධ චරිත හඳුන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඉගෙනගත් කරුණු උපයෝගී කරගෙන සමාජ විද්‍යාව ඉගෙනීමෙන් භික්ෂූන් වහන්සේට ලැබෙන ප්‍රයෝජන පංතියේ ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න. | ඉදිරිපත් කිරීම<br>කේවල |
| හඳුනාගත් සමාජ ගැටලු නිරාකරණයට බුදු දහමෙන් ලැබෙන දායකත්වය කෙසේ දැයි හඳුන්වා දීමට කටයුතු කරන්න. | දේශන ක්‍රමය |
| නායකත්වය ගෙන ක්‍රියා කිරීමේ දී භික්ෂූන් වහන්සේට සමාජ විද්‍යා දැනුම උපකාරි කරගත හැකි අවස්ථා ලිවීමට අවශ්‍ය උපදෙස් දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| හඳුනාගත් සමාජ ප්‍රශ්න ලියා පංතියට ඉදිරිපත් කරවන්න. | ඉදිරිපත් කිරීම |
| ආක්‍රමණශීලි චරිත, බුද්ධිවාදි චරිත, තර්කවාදි චරිත, භෞතිකවාදි චරිත, පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- වාචික ඇගයිම

- ✳ සමාජයේ හමුවන විවිධ පෞරුෂ ලක්ෂණ සහිත චරිත ඉදිරිපත් කර ඒවාට උදාහරණය බැගින් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

01. ආක්‍රමණශීලි චරිත
02. තර්කවාදි චරිත
03. බුද්ධිවාදි චරිත
04. භෞතිකවාදි චරිත

- ✳ ලැබෙන නිවැරදි පිළිතුරු ඇගයිමට ලක් කරන්න.

- පැවරුම

සමාජ විද්‍යාත්මකව විවරණය කරනු ලබන සමාජ ගැටලු කීපයක් ඇමුණුම 02හි දක්වා ඇත. එම ගැටලු පිළිබඳව පුවත්පත්වල පළවෙන ලිපි එකතුවක් නිර්මාණාත්මකව පංතියට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න. (පොත් පිංචක්, බිත්ති පුවත්පතක් වැනි)

✳ ඉහත ක්‍රියාකාරකම කණ්ඩායම් ක්‍රමයට කරන්න.

✳ ක්‍රියාකාරකම පන්ති කාමරයේ දී කිරීමට උපදෙස් දෙන්න.

✳ දින 10 ක් ඇතුළත මෙම නිර්මාණය ඉදිරිපත් කළ යුතු බව දැනුවත් කරන්න.

» නිර්මාණාත්මක හැකියාව

» ලිපිවල සාරවත් බව

» කරුණු ගොනු කිරීම

» කණ්ඩායම් හැඟීම

✳ ඉහත කරුණු මෙම ක්‍රියාකාරකමේ නිර්ණායක ලෙස භාවිත කර සුදුසු ලකුණු ලබා දෙන්න.

ඇමුණුම 01

භික්ෂූන් වහන්සේ නමකගෙන් දායක පිරිසක් උපදෙස් ලබා ගන්නා අයුරු



ඇමුණුම 02

**සමාජ ගැටලු**

01. සියදිවි නසා ගැනීම
02. ගණිකා වෘත්තිය
03. ළමා අපයෝජන
04. තරුණ අසහනය
05. විරැකියාව





# 02. සමාජ පරිණාමය

**නිපුණතාව** - සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්** - 2.1 ප්‍රාථමික අවධියේ සිට නූතන අවධිය දක්වා සමාජය වෙනස් වූ ආකාරය විස්තර කරයි.

2.2 සමාජ හා සමාජ මානව විද්‍යාඥයන්ගේ මතවාද ඇසුරින් සමාජ වෙනස්වීම හඳුනා ගනියි.

2.3 බුදු දහම අනුව සියල්ල වෙනස්වන බවත්, ඒ අනුව සමාජය වෙනස් වන අයුරුත් පෙන්වා දෙයි.

2.4 පිරිවෙණ / පන්සල ඇසුරේ සමාජය වෙනස් වූ අයුරු විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 16 යි.**

**හැඳින්වීම -** සරල සමාජයක සිට සංකීර්ණ සමාජයක් වෙත සංක්‍රමණය වීම සමාජ පරිණාමය වේ. එනම් ප්‍රාථමික සමාජ අවධියක සිට නූතන සමාජ අවධිය දක්වා සමාජය තුළ සිදුවන විකාශනය හෙවත් ක්‍රමානුකූල වර්ධනය සමාජ පරිණාමය ලෙස හැඳින්විය හැකි බවයි. සමාජ පරිණාමය (Social evalution) යන්නට සමාජ විපරිණාමය, විකාශනය, වෙනස්වීම, වර්ධනය, පරිවර්තනය, පෙරළිය, විපර්යාසය, ගතිකත්වය ආදී පර්යාය පද රැසක් භාවිත කරනු ලබයි. බුදු දහමේ අනිත්‍යය, විපරිණාමය ආදී වදන් ද සමාජ පරිණාමය හැඳින්වීමට භාවිත වේ.

සමාජය ගතික ස්වභාවයකින් යුක්තය. රොබට් නිස්බෙට් (Robert Nisbet) දක්වා ඇති පරිදි "වෙනස් වීම යනු කල්පවත්නා අනන්‍යතාවයකින් යුත් කාලීන වෙනස්කම්වල අනුප්‍රාප්තියකි." ඒ අනුව වෙනස්වීම කාලයත් සමග සිදුවන දෙයක් බවත්, සමහර ලක්ෂණ කාලයකට පසුව ද නොවෙනස්ව පවතින බවත් හඳුනා ගත හැකි ය. වෙනස්වීම සම්බන්ධ මෙම ස්වභාවය සමාජ වෙනස්වීම පිළිබඳ සාකච්ඡා කිරීමේ දී වැදගත් වේ. එනම් සමාජ ව්‍යුහයේ ඇතිවන වෙනස්කම් කාලයත් සමග සසඳා බලා තක්සේරු කර ගත හැකි ය. එමෙන්ම සමාජයේ සමහර ලක්ෂණ වෙනස්වන බවත්, සමහර ලක්ෂණ එලෙසම පවතින බවත් හඳුනා ගත හැකිය. සමාජ සම්බන්ධතා රටාව, තත්ත්වය හා කාර්යභාරය, සමාජ සංස්ථා, විශ්වාස, අගයයන්, ප්‍රතිමාන, සිරිත් විරිත්, ආදිය අඛණ්ඩව වෙනස්කම්වලට බඳුන් වේ. මෙම වෙනස්කම් සමාජ ප්‍රගතියට මෙන්ම පරිහාණියට ද හේතු වන බව ද සඳහන් කළ හැකි ය.

සමාජ විද්‍යා විෂය ආරම්භයේ සිට ම සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් සංකල්පයක් ලෙස සමාජ පරිණාමය හෙවත් සමාජ වෙනස් වීම පිළිබඳව විවිධ දෘෂ්ටි කෝණයන් මගින් අධ්‍යයනය කර ඇත. එනම් පරිණාමවාදය, කෘත්‍යවාදය, සට්ටනවාදය ආදී මතවාද පදනම් කරගෙන සමාජ වෙනස්වීම පිළිබඳ සාකච්ඡා කර ඇත. ඒ මගින් සමාජ වෙනස්වීමට බලපාන සාධක රාශියක් හඳුනා ගෙන ඇත. එනම් ජනගහන වර්ධනය ආර්ථික හා තාක්ෂණික සාධක, සංස්කෘතික සාධක, දේශපාලනික සාධක, අධ්‍යාපනික සාධක, නව සොයාගැනීම් හා නව නිෂ්පාදන ආදිය සමාජ වෙනස්වීම් කෙරෙහි බලපායි.

වෙනස්වන සමාජයේ එකම වෙනස් නොවන සාධකය වන්නේ වෙනස්වීම යි. බුදු දහමේ මූලික ඉගැන්වීම් අතර වෙනස්වීම පිළිබඳව අදහස් දක්වා ඇත. භෞතික පරිසරයේ වෙනස්වීම් පමණක් නොව සමාජ පරිසරයේ වෙනස්වීම දක්වෙන ඉගැන්වීම් ද ත්‍රිපිටකාගත සූත්‍ර ධර්මයන් තුළ අන්තර්ගතව තිබේ. එනම් මුල් බුදුසමයට අනුව සමාජ පරිණාමය පිළිබඳව අධ්‍යයනය කළ හැකි ය. එමෙන් ම බෞද්ධ සංස්කෘතික සාධක ද සමාජ සංවර්ධනය කෙරෙහි ප්‍රබල දයකත්වයක් දක්වන බව විහාරස්ථාන හා පිරිවෙන් ක්‍රියාකාරකම් ඇසුරින් අවබෝධ කර ගත හැකි ය.

**නිපුණතාව** - සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** - 2.1 ප්‍රාථමික අවධියේ සිට නූතන අවධිය දක්වා සමාජය වෙනස් වූ ආකාරය විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. ''සමාජ පරිණාමය'' යන්න ප්‍රාථමික හා නූතන සමාජ ඇසුරින් හඳුනාගනී.
2. ප්‍රාථමික සමාජයේ ගති ස්වභාවය හා නවීන සමාජවල ලක්ෂණ වෙන වෙනම හඳුනාගෙන සාකච්ඡා කරයි.
3. එදිනෙදා ජීවිතයේ දී සාමාජිකයා විසින් අත්දකින නවීනත්වය හා තාක්ෂණික දියුණුව සමාජීය සාක්ෂි ඇසුරින් හඳුනාගෙන විස්තර කරයි.
4. සමාජ පරිණාමය යන්න ප්‍රාථමික හා නූතන සමාජ ඇසුරින් ගවේෂණය කොට තොරතුරු එක්රැස් කරයි.

**හැඳින්වීම -** ප්‍රාථමික සමාජය නූතන සමාජය දක්වා විකාශනය වීමේ දී, සමාජ පරිණාමය හෙවත් සමාජ වෙනස්වීම ප්‍රධාන සාධකයක් සේ හඳුනා ගත හැකි ය. කිසියම් සමාජයක් ප්‍රාථමික මට්ටමේ සිට ක්‍රම ක්‍රමයෙන් විකාශනය වන විට ව්‍යුහාත්මක වශයෙන් හා චර්යාත්මක වශයෙන් ද වෙනස් වෙන බව පෙන්වා දිය හැකි ය. සරල නොදියුණු සමවර්ගීයත්වයේ සිට නාගරීකරණය, නවීකරණය, කාර්මීකරණය වැනි දියුණු තත්ත්වයක් දක්වා සමාජය ආගමනය වූ ආකාරය විමර්ශනාත්මකව තේරුම් ගැනීමට හැකි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ✳ කේවල හෝ කණ්ඩායම් ක්‍රියා
- ✳ සාකච්ඡා ක්‍රමය
- ✳ කණ්ඩායම් ක්‍රමය
- ✳ අන්තර්ජාල භාවිතාව (විෂයට අදාළව)

**ආකල්ප හා ඇගයුම්**

1. පන්තියේ සිටින සිසුන් හා සාමූහිකව කටයුතු කිරීම කෙරේ උනන්දු වේ.
2. සමාජ පරිණාමය ධනාත්මක පෙරළියක් බව පවසයි.
3. පරිණාමය පිළිබඳ තමා සොයාගත් කරුණු අන් අය හා බෙදාගනී.
4. සමාජ පරිණාමය යන්න නිරන්තර ක්‍රියාවලියක් බව අවබෝධ කොට ගෙන නව අභියෝගවලට මුහුණ දීමට හැකි මානසිකත්වයක් සකසා ගනී.

**ගුණාත්මක යෙදවුම්**

✳ පාඩමට අදාළ ඡායාරූප, අන්තර්ජාල මෙවලම් හෝ කෘෂිකාර්මික උපකරණ (රූප සටහන්)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

✳ ප්‍රාථමික සමාජ ලක්ෂණ වගුගත කර පෙන්වන්න.

✳ නූතන සමාජ ලක්ෂණ වගුගත කර පෙන්වන්න.

✳ සමාජ පරිණාමය පිළිබඳ සමාජ විද්‍යාඥයන් විසින් පළ කරන ලද අදහස් සිසුන් සමග සාකච්ඡා කරන්න.

✳ සමාජ පරිණාමය අඛණ්ඩව සිදුවන අයුරු සමාජීය සාක්ෂි අනුව (වර්තමාන සමාජයෙන් ගත් උදාහරණ ලබා දෙමින්) කටයුතු කිරීම සඳහා මග පෙන්වන්න.

✳ දියුණු සමාජයක නොතිබිය යුතු එහෙත් නූතන සමාජ තුළ දක්නට ලැබෙන ප්‍රාථමික සමාජ ලක්ෂණ කිහිපයක් උදාහරණ වශයෙන් ගෙන සිසුන්ගේ අවබෝධය උරගා බලන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ප්‍රාථමික තාක්ෂණය මගින් කෘෂිකාර්මික කටයුතු කරන ලද ආකාරය චිත්‍රයකට නගන්න. | කණ්ඩායම් හෝ කේවළ ක්‍රමය |
| නූතන සංකීර්ණ සමාජයක නාගරීකරණ ලක්ෂණ ප්‍රකටවන ආකාරය අළලා පුවරු ලිපියක් සකස් කරන්න. | කණ්ඩායම් හෝ කේවළ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

✳ සමාජ පරිණාමය පිළිබඳ එමිල් ඩුර්කයිම් ඉදිරිපත් කළ මතය කුමක් ද යන්න ඔබේ වචනයෙන් ප්‍රකාශ කරන්න.

✳ සමාජ පරිණාමය සිදු වූ ආකාරය පෙන්වා දෙන්න.

✳ ප්‍රාථමික සමාජයට ආවේණික ලක්ෂණ දෙකක් නම් කරන්න.

✳ නූතන සමාජය කාර්ය බහුල වීම කෙරේ තුඩු දුන් සාධක 05 ක් ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 01**

පැරණි කෘෂිකාර්මික උපකරණ (කිහිපයක ඡායාරූප)

**නිපුණතාව** - සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** - 2.2 සමාජ හා මානව විද්‍යාඥයන්ගේ මතවාද ඇසුරින් සමාජ වෙනස්වීම හඳුනාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. විවිධ සමාජ හා සමාජ මානව විද්‍යාඥයන් ''සමාජ පරිණාමය'' හඳුන්වා දී ඇති ආකාරය පිළිබඳ හඳුනාගනී.
2. සාමාජිකයාගේ ජීවිතය කෙරෙහි බලපාන සමාජ වෙනස්වීම විස්තර කරයි.
3. සමාජ පරිණාමය සාමාජිකයාගේ ජීවිතයට බලපාන ආකාරය අවබෝධ කර ගනී.
4. සියලු සමාජ නිරතුරුවම වෙනස් වන බව හේතු සාධක සහිතව ප්‍රකාශ කරයි.

**හැඳින්වීම** - සමාජ ප්‍රගමනයෙහිලා ඉතා වැදගත් සාධකයක් වන ''සමාජ පරිණාමය'' සමාජ හා සමාජ මානව විද්‍යාවේ දී සාකච්ඡා වන කේන්ද්‍රීය සංකල්පයක් වේ. එක් අවස්ථාවක දී වෙනස්වීම සැකෙවින් සමාජ පරිණාමය ලෙස හඳුන්වා දිය හැකිය. කාලය හා සමග මානව ක්‍රියාකාරකම් හා සබඳතා වෙනස් වී යයි. එහි ප්‍රතිඵලයක් ලෙස මානව සබඳතා මත ගොඩනැගුණු සමාජය ද වෙනස් වේ. සමාජයක පවතින ''ගතික'' ස්වභාවය යනු මෙය යි.

සරල නොදියුණු සමාජය, ඒකාකාරී තත්ත්වයෙන් මිදී කාර්මිකරණය, නාගරිකරණය, නවීකරණය, වාණිජකරණය වැනි දියුණු ගති ලක්ෂණවලින් යුක්ත නූතන අවධිය දක්වා ගමන් කිරීමත්, මෙම තත්ත්වය සමාජිකයාගේ ජීවිතයට බලපෑම් කරනු ලබන ආකාරයත් සමාජ පරිණාමය යටතේ අධ්‍යයනය කරනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* විස්තර කිරීම
* සාකච්ඡා ක්‍රමය
* කාණ්ඩායම් හෝ කේවල ක්‍රමය
* ඉදිරිපත් කිරීම
* ප්‍රදර්ශනය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ පරිණාමය වනාහී මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස නිරන්තරයෙන් සිදුවන්නක් බව දැනගනී.
2. වෙනස්වීම පිළිබඳ න්‍යායාත්මක අර්ථ නිරූපණවලින් කියැවෙන විෂය කරුණු එදිනෙදා සමාජ ජීවිතයේ දී හමුවන බව තේරුම් ගැනීමට සමත් වෙයි.
3. චයෂ්ඨමය සාධක දෙස විමර්ශනාත්මකව බලමින් ස්වකීය ජීවිතය හැඩගස්වා ගනී.

**ගුණාත්මක යෙදවුම්**

- ✳ පාඩමට අදාළ පින්තූර A4 කඩදාසි, පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, බිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

ඇමුණුම 01 ඡායාරූප ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න.

- ✳ සමාජ පරිණාමය පිළිබඳ විවිධ සමාජ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන නිර්වචන 04 පැහැදිලි කර දෙන්න.

- ✳ ඔගස්ට් කොම්ට් - (Auguste Comte) — තර්කානුකූල දැනුමෙන් තොර ප්‍රාථමික මිනිසා සිය ජීවන පරිසරය ''දේවත්වයෙන්'' පිදීමට පෙළඹුන බව.

- ✳ එමිල් ඩුර්කයිම් - (Emile Durkhiem) — ප්‍රාථමික සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුක්ත වූ බව.

- ✳ මැක්ස් වේබර් - (Max Weber) — ප්‍රාථමික සාම්පදායික සමාජය අතාර්කික වූ අතර නූතන සංකීර්ණ සමාජය තර්කානුකූල වන බව.

- » කාල් මාක්ස් - (Karl Marx) — ධනපතියා විසින් නිර්ධන පන්තිකයා පීඩනයට ලක් කර ශ්‍රමය සූරා කන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගැටුම් උද්ගත වන බව හා සමාජය පරිණාමය වන බව.

- ✳ ඉහත සඳහන් නිර්වචන ආශ්‍රයෙන් සමාජ පරිණාමය යන්න පැහැදිලි කර දෙන්න.

- ✳ සමාජයකින් ප්‍රකට වන මූලික ස්වභාවයක් ලෙස ''සමාජ පරිණාමය'' හඳුනා ගැනීමට උදාහරණ ඉදිරිපත් කරන්න.

  උදා : සරළ තාක්ෂණය හා දියුණු සංකීර්ණ තාක්ෂණය
  මිනිස් ශ්‍රමය හා යාන්ත්‍රික බල ශක්තිය.

- ✳ ප්‍රාථමික සම්ප්‍රදායික සමාජය - සමාජීය වශයෙන්, තර්කික වශයෙන් බුද්ධිමය වශයෙන්, සාධිත දිශානතික නූතන දියුණු අවධිය දක්වා පරිවර්තනය වූ බව හඳුනා ගැනීමට මග පෙන්වන්න.

- ✳ සෑම සාමාජිකයකු ම සමාජීය සත්ත්වයෙකු වශයෙන් සමාජ පරිණාමී ක්‍රියාවලියට නතු වන බව සහ එම අත්දැකීමට මුහුණ දිය යුතු බව අවබෝධ කර දෙන්න. භාවිතාවේ යොදවන්න. නිරීක්ෂණය කරන්න. (ඇමුණුම 02)

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඔගස්ට් කොම්ට් - Auguste Comte<br>එමිල් ඩුර්කයිම් - Emile Durkhiem<br>මැක්ස් වේබර් - Max Weber<br>කාල් මාක්ස් - Karl Marx<br>යන සිව්දෙනා සමාජ පරිණාමය පිළිබඳ ඉදිරිපත් කළ මතවාද සාරාංශ කොට බ්‍රිස්ටල් බෝඩ් ආධාරයෙන් අලංකාර පුවරු 04ක් නිර්මාණය කරන්න. | ප්‍රදර්ශනය හා හඬනගා කියවීම<br>නිර්මාණකරණය. |

| | |
|---|---|
| පන්තියේ සිසුන් වෙත එම පුවරු ප්‍රදර්ශනය කරමින් ''සමාජ පරිණාමය'' යන්න විස්තර කිරීමට ඉඩ සළසා දෙන්න. | සාකච්ඡා ක්‍රමය, දේශන ක්‍රමය |


**ඇගයීම හා තක්සේරුකරණය**

- ✷ සමාජ පරිණාමය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයන් 04 දෙනෙකු නම් කරන්න.
- ✷ සමාජ පරිණාමය පිළිබඳව සමාජ විද්‍යාඥයකු විසින් ඉදිරිපත් කළ නිර්වචනයක් නිවැරදිව ලියා දක්වන්න.
- ✷ දේවවාදී අවධිය හා යථානුභූත අවදිය අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න.
- ✷ ප්‍රාථමික සමාජ ලක්ෂණ 05ක් ලියා දක්වන්න.
- ✷ නූතන සමාජ ලක්ෂණ 05ක් ලියා දක්වන්න.
- ✷ වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ දක්නට ලැබෙන සාධිත තත්ත්වය සඳහා උදාහරණ 03ක් ලබා දෙන්න.


**ඇමුණුම 01**

සමාජ පරිණාමය පිළිබඳ මතවාද ඉදිරිපත් කළ විද්‍යාඥයන් කිහිප දෙනෙක්,


ඔගස්ට් කොම්ට්
Auguste Comte



එමිල් ඩුර්කයිම්
Emile Durkheim


මැක්ස් වේබර්
Max Weber


කාල් මාක්ස්
Karl Marx

**ඇමුණුම 02**

මානව පරිණාමය දැක්වෙන සටහන



**නිපුණතාව** - සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** - 2.3 බුදු දහම අනුව සියල්ල වෙනස් වන බවත්, ඒ අනුව සමාජය වෙනස් වන අයුරුත් පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 04 යි.

**ඉගෙනුම් පල**

1. සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් දැනගෙන කියයි.
2. වෙනස්වීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අවබෝධයෙන් ප්‍රකාශ කරයි.
3. අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් සමාජ පරිණාමය සිදුවන ආකාරය පැහැදිලි කරයි.
4. සමාජයේ කොටස් කරුවෙකු ලෙස සාමාජිකයාගේ යහපැවැත්මේ වැදගත්කම ප්‍රකාශ කරයි.

**හැඳින්වීම** - වෙනස්වීම නම් සංකල්පය බුදු දහමේ දැක්වෙන මූලික ම ඉගැන්වීමකි. මිනිසා තම ජීවිතයේ දී ළදරු විය, ළමා විය, යොවුන් විය, මැදි විය, මහලු විය යන අවධි පසුකරමින් ගමන් කිරීමේ දී විවිධාකාර වෙනස්කම් රැසකට භාජනය වේ. '' විපරිණාම දුක්ඛ'' යනුවෙන් බුදු දහමෙහි දක්වා ඇත්තේ මෙකී තත්ත්වයයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* විස්තර කිරීම
* සාකච්ඡා ක්‍රමය
* කේවල හෝ කණ්ඩායම් ක්‍රියා
* ඉදිරිපත් කිරීම
* ප්‍රදර්ශනය

**ආකල්ප හා ඇගයුම්**

1. විපරිණාම දුක්ඛ යනුවෙන් බුදු දහමේ හඳුන්වනු ලබන තත්ත්වය අධ්‍යයනය කරයි.
2. උප්පාද, ඨිති, භංග යන ධර්මතා අවබෝධ කර ගැනීමට හැකි වෙයි.
3. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා සීල ප්‍රතිපත්තිය මැනවින් උපකාරී වන අයුරු වටහා ගනියි.
4. යහපත් සමාජයක් නිර්මාණය කර ගැනීමෙහිලා ඉවහල් වන බුදු දහමේ ඉගැන්වෙන පරිණාම ස්වභාව ධර්මතා මැනවින් උගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* පාඩමට අදාළ පින්තූර (සිතුවම් මගින් හෝ වෙනස්වීම දක්වමින් වචනයෙන්)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

* බුදු දහමේ ඉගැන්වෙන විපරිණාම දුක්ඛ පිළිබඳව විස්තර කරන්න.
* උප්පාද, ඨිති, භංග යන ධර්මතා තුන හඳුන්වා දෙමින් පුවරු ලිපියක් සපයන්න. (බිත්ති පුවත්පත සඳහා)
* ස්ථිතික හා ගතික සමාජ ස්වභාවයන් වෙන වෙනම පැහැදිලි කරන්න.
* සමාජ සංවර්ධනය සඳහා සමාජයේ සාමාජිකයන්ගේ යහ පැවැත්ම වැදගත්වන ආකාරය බුදු දහම ඇසුරින් පෙන්වා දෙන්න.

ක්‍රියාකාරී සැලැස්ම

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පෘථිවිය මත ජීවයේ ආරම්භය ඇති වූ අවස්ථාවේ සිට ''මිනිසාගේ'' බිහිවීම දක්වා පරිණාමීය අවස්ථා (අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින්) චිත්‍රයකට නගන්න. | ප්‍රදර්ශනය |

ඇගයීම හා තක්සේරුකරණය

* සමාජ පරිණාමය චයඞාමය සාධකවල ප්‍රතිඵලයක් බව බෞද්ධ දර්ශනයට අනුව පැහැදිලි කරන්න.
* බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් සමාජ පරිණාමය විස්තර කරන්න.
* යහපත් පුද්ගලයකු බවට පත්වීම සඳහා අවශ්‍ය බෞද්ධ ඉගැන්වීම් ප්‍රකාශ කරන්න.
* සමාජයේ දියුණුව උදෙසා සමාජයේ සාමාජිකයන්ගේ යහ පැවැත්ම වැදගත් වන ආකාරය නිදසුන් දෙකක් මගින් පෙන්වා දෙන්න.

ඇමුණුම 01

බුදු දහමේ පුද්ගලයෙකුගේ දර්ශනය දැක්වෙන රූප සටහනක්



**නිපුණතාව** - සමාජ පරිණාමය පිළිබඳ විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** - 2.4 පිරිවෙණ / පන්සල ඇසුරේ සමාජය වෙනස් වූ අයුරු විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. පැරණි ලාංකික අධ්‍යාපන රටාව පිළිබඳ අධ්‍යයනය කරමින් විහාරස්ථානයක් මගින් සමාජයට සැලසූ සේවාවන් සඳහන් කරයි.
2. පිරිවෙන් ඇසුරින් මුල් පෙළ නායකයන් පවා ගොඩනැගුණු ආකාරය හා ඔවුන්ගෙන් සමාජයට වූ සේවාවන් ප්‍රකාශ කරයි.
3. පිරිවෙණ / විහාරස්ථානය මගින් සිදු වූ සේවාව උදාහරණ මගින් විස්තර කරයි.
4. විහාරස්ථානය හා පිරිවෙණ ඇසුරේ ශික්ෂාකාමී උගතෙකු බිහි වන බව තර්කානුකූලව ප්‍රකාශ කරයි.

**හැඳින්වීම** - මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකික ජන සමාජයට දායාද වූ සුවිශේෂී ආයතනයක් වන විහාරස්ථානය ඇසුරින් පැරණි ආරාමික අධ්‍යාපන ක්‍රමය බිහිවිය. කාලානුරූපව සමාජ අවශ්‍යතාවනට සරිලන පරිදි පිරිවෙණ නම් ආයතනය පසුව බිහිවිය. ඒ සමග ආරම්භ වූ දේශීය වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය, සාරධර්ම අධ්‍යයනය ආදිය ද විහාරස්ථානය ඇසුරේ පෝෂණය විය. මෙකී නව ප්‍රවණතාවනට අනුරූපව විහාරස්ථානය හා පිරිවෙණ කේන්ද්‍රකොට ගෙන මෙරට සමාජය වෙනස්වන ආකාරය මෙම මාතෘකාව යටතේ සාකච්ඡා කරනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* ප්‍රදර්ශන ක්‍රමය
* ආදර්ශනය
* කේවල හෝ කණ්ඩායම් ක්‍රියා
* සාකච්ඡා ක්‍රමය
* ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. ශ්‍රී ලාංකික සමාජය තුළ ක්‍රියාත්මක වන බහුකාර්ය ආයතනයක් ලෙස විහාරස්ථානය/ පිරිවෙණ හඳුනාගනී.
2. මිනිසාගේ උපතේ සිට මරණය දක්වා විහාරස්ථානය මගින් කරනු ලබන සේවාව අගය කරයි.
3. දෙස් විදෙස් වියතුන්ගේ අප්‍රමාණ ගෞරවාදරයට පාත්‍ර වූ ශ්‍රී ලාංකික සමාජයේ සදාචාර සංවර්ධනය උදෙසා විහාරස්ථානයෙන් සිදු වූ මෙහෙවර අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

* උදාහරණ ලෙස ඉදිරිපත් කළ හැකි තම පිරිවෙනෙන් බිහි වූ වියතුන්ගේ රූප රාමු, නාම ලේඛණ, ලිපි, පොත්, අධ්‍යාපන උපකරණ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ ලක්දිව බිහි වූ ප්‍රකට විද්වතුන් 10 දෙනෙකු නම් කරන්න. (මහින්දාගමනයෙන් පසුව)
- ✳ සමාජය වෙනස් වීම කෙරෙහි පිරිවෙණ/ විහාරස්ථානය ඇසුරින් බිහි වූ ජාතික විරුවන්ගේ කාර්යභාරය හේතු වූ අයුරු උදාහරණ මගින් පහදන්න.
- ✳ නව චර්යා පද්ධතියක් හා අගනාකම් පද්ධතියක් මාර්ගයෙන් වර්තමාන සමාජය යහපත් ලෙස වෙනස් කළ හැකි බව උදාහරණ මගින් පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| විවාදයක් සංවිධානය කිරීම. (ගුරුවරයා විසින් ලබාදෙන ජාතික විරුවන් පිළිබඳ, වියතුන් පිළිබඳ තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීම).<br>විවිධ නිර්ණායක යටතේ අගයන්න. | විවාදය |
| ජාතික විරුවෙකු පිළිබඳ පුවත්පතක් සඳහා ලිපියක් ලිවීමට අවශ්‍ය උපදෙස් ලබාදීම. (පසු වැඩක් ලෙස දෙන්න). | ප්‍රකාශනය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- ✳ අනුරාධපුර යුගයේ ආරම්භ කළ පිරිවෙන් ආයතන දෙකක් නම් කරන්න.
- ✳ පිරිවෙන් ආරම්භ වීමට පෙර විහාරස්ථානයක් මගින් සමාජයට වඩාත් යහපත් පුරවැසියන් බිහි කළ බව උදාහරණ දෙකක් මගින් සාකච්ඡා කරන්න.
- ✳ ශ්‍රී ලංකීක සමාජය වෙනස් කිරීමට මහින්දාගමනය හේතු වූ බව පෙන්වා දෙන්න.
- ✳ විහාරස්ථානය/ පිරිවෙණ ඇසුරින් බිහි වූ නායකයන් 10 දෙනෙකුගේ තොරතුරු ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 01**

- ✳ පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහිව ලෝකය ජයගත් හිමිවරුන්ගේ, ගිහි උගතුන්ගේ රූපරාමු.

## 03. සංස්කෘතිය

**නිපුණතාව -** සංස්කෘතිය යන්න හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම් -** 3.1 සංස්කෘතිය යනු කුමක් දැයි පැහැදිලි කරයි.

3.2 සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති සබඳතාව පැහැදිලි කරයි.

3.3 බුදු දහම මගින් අපට අගනා සංස්කෘතියක් දායාද කර ඇති අයුරු පෙන්වා දෙයි.

3.4 ශ්‍රී ලංකාවේ පවතින අනෙකුත් සංස්කෘති පිළිබඳ සරලව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 07**

**හැඳින්වීම -** සංස්කෘතිය යනු තමා අයත්වන ජන වර්ගයේ අනන්‍යතාව ලෙස හැඳින්විය හැකි ය. සමාජ විද්‍යාව මගින් එහි මූලික සංකල්පයක් ලෙස සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ. මානව විද්‍යාව, සමාජ මනෝවිද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව වැනි අනෙකුත් සමාජීය විද්‍යාවන් මගින් ද සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමට වැඩි සැලකිල්ලක් දක්වනු ලබන්නේ සමාජය සමග සංස්කෘතියෙහි ඇති අවියෝජනීය සම්බන්ධතාව නිසා ය. සංස්කෘතියක් දක්නට ලැබෙන්නේ මිනිස් සමාජයක පමණි. දුප්පත් පොහොසත්, නාගරික ග්‍රාමීය, කළු සුදු ආදි කුමන විෂමතාවක් තිබුණ ද සෑම සමාජයකම පදනම වන්නේ සංස්කෘතිය යි. මිනිසා විසින් නිර්මාණය කර ගන්නා ලද සංස්කෘතිය ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස පරපුරෙන් පරපුරට ගලා යයි. මෙකී ඉගෙනුම් ක්‍රියාවලිය සමාජානුයෝජනය නමින් හැඳින්වේ.

**නිපුණතාව -** සංස්කෘතිය යන්න හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම -** 3.1 සංස්කෘතිය යනු කුමක් දැයි පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 01 යි.**

**ඉගෙනුම් පල**

1. නිර්වචන කිහිපයක් ඇසුරින් සංස්කෘතිය යන්න පැහැදිලි කරයි.
2. සංස්කෘතිය සමාජ උරුමයක් වන බවත් සමාජය සංස්කෘතියට අනුව හැඩ ගැසෙන බවත් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
3. එදිනෙදා භාවිත වන ආම්පන්න ඇසුරින් සංස්කෘතිය හඳුනාගෙන විස්තර කරයි.

**හැඳින්වීම -** මිනිසා විසින් ස්වකීය පැවැත්ම සඳහා නිර්මාණය කර ගන්නා ලද භෞතික වූත්, අභෞතික වූත් සියල්ලෙහි එකතුව සංස්කෘතිය නමින් හඳුන්වනු ලැබේ. මේ අනුව සංස්කෘතිය යන්න සමාජ උරුමයක් බව පැහැදිලි වේ. එමෙන්ම අනෙක් අතට සෑම සමාජයක්ම සංස්කෘතියට අනුව හැඩ ගැසෙන බව තහවුරු වේ. මෙකී සංස්කෘතිය විවරණය කර දැක්වීම සඳහා සමාජ හා සමාජ මානව විද්‍යාඥයන් විසින් නිර්වචන රැසක් ඉදිරිපත් කර ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* ප්‍රදර්ශනය
* ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. ස්වකීය උරුමයක් බව දැන සංස්කෘතිය රැක ගැනීමට ඉදිරිපත් වේ.
2. එදිනෙදා භාවිත වන ආම්පන්න ඇසුරින් තම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

* පෑන්, පැන්සල්, බ්‍රිස්ටල් බෝඩ්, නිර්වචන ලියන ලද පුවරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* සංස්කෘතිය සඳහා ඉදිරිපත් වී ඇති නිර්වචන තුනක් ලියන ලද පුවරුවක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න. (පෙළපොතෙහි ඇති නිර්වචන ඒ සඳහා යොදා ගන්න).
* එම නිර්වචන සිසුන් සමග හඬනගා කියවන්න.
* එම නිර්වචන විග්‍රහ කරමින් සංස්කෘතියක අන්තර්ගතය හඳුනා ගැනීමට මග පෙන්වන්න. (ඇමුණුම් 01 උපකාර කරගන්න)
* සමාජයක් හැඩ ගැසෙන්නේ සංස්කෘතියකට අනුව බව පහදා දෙන්න.
* අප එදිනෙදා පරිහරණය කරන ආම්පන්න ඇසුරින් අපේ සංස්කෘතිය හඳුනා ගැනීමට මග පෙන්වන්න. (ඇමුණුම 02 කෙරෙහි අවධානය යොමු කරන්න).

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඊ.බී. ටයිලර්, රැල්ෆ් ලින්ටන්, බී. මැලිනොව්ස්කි යන තිදෙනා විසින් ඉදිරිපත් කරන ලද නිර්වචන සඳහන් පුවරුවක් ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න. ප්‍රදර්ශනය කළ නිර්වචන හඬ නගා කියවීමට සිසුන් යොමු කරන්න. | ප්‍රදර්ශන |
| ඉදිරිපත් කළ නිර්වචනවල අඩංගු කරුණු ඇසුරින් සංස්කෘතිය යන්න හඳුනා ගැනීමට මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| නිර්වචන ඇසුරින් හඳුනාගත් සංස්කෘතියේ අන්තර්ගතයට අයත් කරුණු පංතියට ඉදිරිපත් කිරීමට සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව සලසන්න. | කේවල ක්‍රමය |
| අප එදිනෙදා පරිහරණය කරන ආම්පන්න නම් කිරීමට සිසුන් යොමු කරන්න. ඒ ඇසුරෙන් ගොවි සංස්කෘතිය, පැව්දි සංස්කෘතිය, බෞද්ධ සංස්කෘතිය ආදි අනන්‍යතා හඳුනා ගැනීමට හැකි බව පෙන්වා දෙන්න. | ඉදිරිපත් කිරීම<br><br>සාකච්ඡා ක්‍රමය |

පංතියේ ශිෂ්‍ය සංඛ්‍යාවට ගැලපෙන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට ඔබට අවස්ථාව ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය**

- ✵ සංස්කෘතිය නිර්වචනය කළ සමාජ විද්‍යාඥයන් දෙදෙනෙකු නම් කරන්න.
- ✵ සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියා දක්වන්න.
- ✵ සංස්කෘතියේ අන්තර්ගතයට අයත් කරුණු 04 ක් ලියන්න.
- ✵ සිංහල සමාජය පිළිගත් සිරිත් දෙකක් නම් කරන්න.
- ✵ ග්‍රාමීය ගොවි සමාජයේ භාවිත වන ආම්පන්න ඇසුරින් ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව පැහැදිලි කරන්න.

ඇමුණුම 1

**සංස්කෘතියක අන්තර්ගතයෙහි කැපීපෙනෙන කොටස් කිහිපයක් :** භාෂාව, ආගම, සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, ආහාර රටා, ඇගයුම්, විශ්වාස, පුරුදු, කලාව, සාහිත්‍යය, ජීවිකා වෘත්ති, ඉදිකිරීම්, ආම්පන්න.

ඇමුණුම 2

**එදිනෙදා පරිහරණය කරන ආම්පන්න කිහිපයක් :** සිවුර, පාත්‍රය, පොත්පත්, හිස්වැසුම්, පාවහන්, නගුල, උදැල්ල, නැඹිලිය, කොරහ, සේරුව, බිස්ස, අටුව, ඔරුව, දැල්, බිලිපිත්ත, මිටිය, කිණිහිරය, මයිනහම.

**නිපුණතාව -** සංස්කෘතිය යන්න හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම -** 3.2 සාමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති සබඳතාව පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජානුයෝජනය යන්න අර්ථ දක්වයි.
2. මානව චර්යාව හා සංස්කෘතිය අතර සම්බන්ධය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
3. සමාජානුයෝජන කාරක නම් කර ඒවායේ කාර්යභාරය ප්‍රකාශ කරයි.
4. පෞරුෂ වර්ධනය සඳහා සමාජානුයෝජන ක්‍රියාවලිය දායක වන ආකාරය පැහැදිලි කරයි.

**හැඳින්වීම -** මානව චර්යාවේ පදනම සංස්කෘතිය යි. උපතේ සිට සෑම සමාජිකයෙකුම සංස්කෘතිය ග්‍රහණය කර ගනු ලැබේ. එලෙස ග්‍රහණය කර ගනු ලබන සංස්කෘතියට අනුව ජීවත් වන හෙයින් මිනිසා සාමාජිකයෙකු හෙවත් සංස්කෘතික සත්ත්වයෙකු ලෙස හඳුන්වනු ලැබේ. සංස්කෘතිය ග්‍රහණය කර ගැනීම අනුයෝජනය හැටියට ද හඳුන්වයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. යහ පුරුදු ජීවිතයට බද්ධ කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි.
2. සමාජයේ ප්‍රසංසාව හිමිකර ගත හැකි චරිතයක් සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* ''සමාජානුයෝජනය'' යන වචනයේ අර්ථය පිළිබඳ සිසුන්ගේ දැනුම අවධි කරමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම 01)
* ඒ අනුව සමාජානුයෝජනය යනු සංස්කෘතිය පවරා දීම මගින් සාමාජිකයා සමාජයට අනුගත කිරීමේ ක්‍රියාවලිය බව පෙන්වා දෙන්න.
* පෞරුෂ වර්ධනය සඳහා සමාජානුයෝජනය මගින් වන මෙහෙය පෙන්වා දෙන්න.
* පවුල, පාසල, පන්සල, මිත්‍ර කණ්ඩායම්, ජනමාධ්‍ය යන සමාජානුයෝජන කාරකවල කාර්ය භාරය පිළිබඳ කරුණු ගොනු කිරීම සඳහා කණ්ඩායම් 05 කට හෝ සිසුන් පස් දෙනෙකුට හෝ පවරන්න. අවශ්‍ය මගපෙන්වීම් කරන්න. තමන් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. ඒ අවස්ථාවේදීම ඇගයීමට ලක් කරන්න. (ඇමුණුම 02)

* සාමණේරයන් වහන්සේගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සේඛියාවල ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජයෙන් අප ඉගෙනගත් හොඳ පුරුදු පිළිබඳ සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| අප ඉගෙනගත් හොඳ පුරුදු හා ඇවතුම් පැවතුම් සමාජයේ ප්‍රසාදය දිනා ගැනීමට හේතුවන ආකාරය පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතිය පවරාදීම ''සමාජානුයෝජනය'' බව වටහා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| ඒ අනුව සංස්කෘතිය හා සමාජානුයෝජනය අතර ඇති සබඳතාව අවබෝධ කර ගැනීමට මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| භික්ෂු ජීවිතය සකස්කර ගැනීමේ දී සේඛියාවලින් ලැබෙන මග පෙන්වීම පිළිබඳ දැනුම අවදි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජානුයෝජන කාරකයන් වන පවුල, පාසල, පන්සල, මිත්‍ර කණ්ඩායම්, ජනමාධ්‍ය යන ඒවායෙහි කාර්යභාරය පිළිබඳව කරුණු රැස්කිරීම සඳහා පංතිය කණ්ඩායම් 05 කට බෙදන්න. රැස්කළ තොරතුරු පංතියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. | කණ්ඩායම් හෝ කේවල ක්‍රමයට<br><br>ඉදිරිපත් කිරීම |

පංතියේ ශිෂ්‍ය සංඛ්‍යාවට ගැලපෙන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය**

* සමාජානුයෝජනය යනු කුමක් ද?
* සමාජානුයෝජනය මගින් සමාජයට ඇතිවන ප්‍රයෝජන දෙකක් ලියන්න.
* සමාජානුයෝජන කාරක 04 ක් නම් කරන්න.
* සමාජානුයෝජන කාරකයක් ලෙස මානව පවුලෙන් ඉටුවන කාර්යයන් දෙකක් ලියන්න.
* සාමණේරයන් වහන්සේගේ ජීවිතය යහපත් කර ගැනීමට සේඛියා මගින් ලැබෙන ශික්ෂණය පැහැදිලි කරන්න.

ඇමුණුම 01

**සමාජානුයෝජනය - සමාජයට අලුතින් එකතුවන සාමාජිකයන් සමාජයට අනුකූල ලෙස හැඩ ගැස්වීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනයයි. පීටර් වර්ස්ලි (Peter Worsly) පවසන්නේ ''සමාජානුයෝජනය යනු සංස්කෘතිය පවරා දීමේ ක්‍රියාවලියයි'' යනුවෙන් ය.**

**සමාජානුයෝජන කාරක-සමාජානුයෝජනය සඳහා දායක වන ආයතන සමාජනුයෝජන කාරක ලෙස හැඳින්වේ.**

ඇමුණුම 02

| සමාජානුයෝජන කාරකය | එහි කාර්යයන් කිහිපයක් |
|---|---|
| පවුල | ✱ හොඳ නරක පිළිබඳ දැනුම ලබා දීම.<br>✱ සමගියෙන් කටයුතු කිරීමේ හුරුව ලබා දීම.<br>✱ ආදරය දැක්වීමේ හුරුව ලබා දීම.<br>✱ ආහාර චාරිත්‍ර හුරු කිරීම.<br>✱ භාෂා කුසලතා පෝෂණය කිරීම.<br>✱ චාරිත්‍ර වාරිත්‍ර හුරු කිරීම. |
| පාසල/ පිරිවෙණ | ✱ මිතුරන් සමග සහයෝගයෙන් වැඩ කිරීමට හුරු කිරීම.<br>✱ පොදු මතයට අවනත වීමට හුරු කිරීම.<br>✱ බෙදා හදා ගැනීම හුරු කිරීම.<br>✱ සිරිත් විරිත්වලට ගරු කිරීමට හුරු කිරීම.<br>✱ නීතියට අවනත වීමට හුරු කිරීම.<br>✱ විරුද්ධ අදහස්වලට ගරු කිරීමට හුරු කිරීම. |
| පන්සල | ✱ සාරධර්ම හා අගනාකම් පිළිබඳ හැඟීමක් ලබා දීම.<br>✱ (කුසල්, අකුසල්) පින පව යන සංකල්ප පිළිබඳ දැනුම ලබා දීම.<br>✱ විනීත බව, සංවර බව හුරු කිරීම.<br>✱ සංස්කෘතික ආචාර ධර්ම හුරු කිරීම. |
| මිත්‍ර කණ්ඩායම් | ✱ නායකත්වය දැරීම, නායකත්වයට අවනත වීමට හුරු කිරීම.<br>✱ සහයෝගීතාව හුරු කිරීම.<br>✱ සුචරිතයට තැන දීම හා සත්‍යවාදී බව හුරු කිරීම.<br>✱ ජය පරාජය සමව ඉවසීමට හැකියාව ලබා දීම.<br>✱ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාවක් ලබා දීම. |
| ජනමාධ්‍යය | ✱ දැනුම ලබා ගැනීමට උදව් වීම.<br>✱ තොරතුරු දැන ගැනීමට අවස්ථාව නිර්මාණය කිරීම.<br>✱ අන්‍ය සංස්කෘතීන් පිළිබඳ දැනුම ලබා දීම.<br>✱ විනෝදාස්වාදය ලබා ගැනීමට ඉඩ සලසා දීම.<br>✱ විශ්ව දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දීම. |

**නිපුණතාව -** සංස්කෘතිය යන්න හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම -** 3.3 බුදු දහමින් අපට අගනා සංස්කෘතියක් දායාද කර ඇති අයුරු පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. බුදු දහම පැමිණීමත් සමග ප්‍රාථමික සිංහල සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය බවට පත් වූ ආකාරය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
2. සිංහල සංස්කෘතියෙන් පිළිබිඹුවන බෞද්ධ ලක්ෂණ හඳුනා ගෙන පෙන්වා දෙයි.
3. ප්‍රාථමික සමාජයේ ඇතැම් ඇදහිලි බෞද්ධ ඉගැන්වීම් හේතුවෙන් වෙනස් වූ අයුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
4. සිංහල බෞද්ධ සංස්කෘතයෙහි අන්තර්ගත පරාර්ථකාමී බව හා සහජීවනය හුරු කරගෙන පන්ති කාමරයේ දී ඒවා ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වෙයි.

**හැඳින්වීම -** ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති ප්‍රාථමික සිංහල සංස්කෘතිය මහින්දාගමනයෙන් පසු බුදු දහමින් පෝෂණය වී සිංහල බෞද්ධ සංස්කෘතිය බවට පත්විය. එතැන් සිට චර්යාමය වශයෙන් වෙනසක් ඇති වන අතර ජීවන වෘත්තීන් ද දියුණුවට පත් විය. සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍රවල වෙනසක් සිදුවිය. ආගමික උත්සව රැසක් ආරම්භ වූ අතර පරාර්ථකාමී බව, අවිහිංසාව, සත්‍යවාදි බව වැනි ගුණධර්ම නිසා සිංහල බෞද්ධ සංස්කෘතිය අභිමානවත් එකක් බවට පත් වී ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- වීඩියෝ දර්ශනය

**ආකල්ප හා ඇගයුම්**

1. සිංහල සංස්කෘතියෙන් ප්‍රකට වන බෞද්ධ ලක්ෂණ පෙන්වා දෙයි.
2. සිංහල බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ගුණාංග හඳුනා ගෙන. එම ගුණාංග සහිත සංස්කෘතිය රැක ගැනීමට ඉදිරිපත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය, වීඩියෝ තැටි හා අවශ්‍ය යාන්ත්‍රික මෙවලම්.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ ඉන්දීය ආර්ය කණ්ඩායම්වල සංස්කෘතිය හා සමග ශ්‍රී ලාංකික සමාජයේ මුල් පදිංචි කරුවන්ගේ සංස්කෘතිය සම්මිශ්‍රණය වීමෙන් සිංහල සංස්කෘතිය නිර්මාණය වූ බව පෙන්වා දෙන්න.
- බුදුදහමේ ඉගැන්වීම් නිසා ප්‍රාථමික සිංහල සංස්කෘතිය වෙනස් වූ ආකාරය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.

* බෞද්ධ උත්සව පිළිබඳව සිසුන්ගේ දැනුම අවදි කරන්න.
* බෞද්ධ සංස්කෘතියේ වටිනාකම් පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
* මහින්දාගමනයෙන් අප ලද දායාද පිළිබඳ සිසුන්ගේ දැනුම අවදි කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ප්‍රාථමික සමාජයේ පැවැති ඇදහිලි හා විශ්වාස ඇතුළත් වීඩියෝ දර්ශනයක් හෝ රූප රාමු කිහිපයක් පෙන්වා පාඩමට පිවිසෙන්න.<br>(උදාහරණ ලෙස : විජය-කුවේණි, මහින්දාගමනය වැනි චිත්‍රපටි කොටසක්) | ප්‍රදර්ශනය කිරීම |
| ප්‍රාථමික සංස්කෘතියේ හඳුනා ගත් ලක්ෂණ පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන් දෙදෙනෙකුට අවස්ථාව ලබා දෙන්න. (වෘක්ෂ වන්දනාව, මළගිය ඥාතීන් පිදීම වැනි) | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |
| ප්‍රාථමික සමාජයේ ඇදහිලි වෙනස් වී බෞද්ධ ඉගැන්වීම් අනුව ගොඩනැගුණු නව ඇදහිලි හඳුනා ගැනීමට මගපෙන්වන්න. (ඇමුණුම 01 කෙරෙහි අවධානය යොමු කරන්න.) | සාකච්ඡා ක්‍රමය |
| සිංහල බෞද්ධ සංස්කෘතියේ අන්තර්ගත වැදගත් ලක්ෂණ පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලස්වන්න. | කේවල ක්‍රමයට ඉදිරිපත් කිරීම |
| මහින්දාගමනයෙන් අප ලද දායාද කිහිපයක් පන්තිය ඉදිරියේ ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න. (ඇමුණුම 02 කෙරෙහි අවධානය යොමු කරන්න.) | කේවල හෝ කණ්ඩායම් ඉදිරිපත් කිරීම. |

පංතියේ ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ගුරුවරයාට අවස්ථාව ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය**

* මහින්දාගමනයට පෙර ශ්‍රී ලාංකික සමාජයේ පැවැති ඇදහිලි දෙකක් ලියන්න.
* සිංහල සංස්කෘතියේ බෞද්ධ ලක්ෂණ දෙකක් ලියන්න.
* සිංහල බෞද්ධ සංස්කෘතියෙහි අගය කෙරෙන ධාර්මික රැකියා දෙකක් ලියන්න.
* සිංහල බෞද්ධ සංස්කෘතියේ පරාර්ථකාමී බව පෙන්වීමට උදාහරණ දෙකක් දෙන්න.
* මහින්දාගමනයෙන් අප ලද දායාද පිළිබඳ අදහස් දක්වන්න.

ඇමුණුම 1

| ප්‍රාථමික සිංහල සංස්කෘතියට අයත් ඇදහිලි හා විස්වාස | බෞද්ධ ඉගැන්වීම් නිසා ගොඩනැගුණු විකල්ප අංග |
|---|---|
| වෘක්ෂ පූජා | බෝධි වන්දනාව |
| පර්වත පිදීම | චෛත්‍ය වන්දනාව |
| නෑ යකුන් පිදීම | මියගිය අයට පිංදීම |
| බිලිපූජා පැවැත්වීම | ජීවිත දානය දීම |

ඇමුණුම 2

| | |
|---|---|
| ධාර්මික රැකියා | ගොවිතැන, සාධාරණ වෙළඳාම, රාජ්‍ය සේවය, කර්මාන්ත කිරීම. |
| බෞද්ධ උත්සව | බෞද්ධ පෙරහැර, කඨින පිංකම, වෙසක්, පොසොන්, ඇසළ උත්සව |
| ශිල්පීය ඥානය | වාරි කර්මාන්තය, ඉදිකිරීම් ශිල්පය, ලෝකුරු කර්මාන්තය, කුඹල් කර්මාන්තය, චිත්‍ර, මූර්ති කැටයම් ශිල්ප, වෛද්‍ය ශාස්ත්‍රය |
| පරාර්ථකාමිත්වය | මල්වතු, පළතුරු උයන් වැවීම, පැන් පොකුණු තැනීම, කුඹුරේ කොටසක් කුරුල්ලන්ට වෙන් කිරීම, කෘමිනාශක වෙනුවට කෙම් ක්‍රම භාවිතය, කුල ක්‍රමය ප්‍රතික්ෂේප කිරීම, දන්සැල් පැවැත්වීම, සිල්වතුන්ට උවටැන් කිරීම |

**පසු වැඩ**

✴ මහින්දාගමනයෙන් අප ලද දායාද ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**නිපුණතාව -** සංස්කෘතිය යන්න හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම -** 3.4 ශ්‍රී ලංකාවේ පවතින අනෙකුත් සංස්කෘති පිළිබඳ සරළව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. වාර්ගික විෂමතාවේ පදනම සංස්කෘතිය බව පෙන්වා දෙයි.
2. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් බව අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි.
3. අන්‍ය සංස්කෘතිවල ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
4. සහජීවනයේ වටිනාකම හඳුනා ගෙන අනෙකුත් සංස්කෘතින්ට ගරු කරයි.

**හැඳින්වීම -** බාහිරින් එල්ල වූ සංක්‍රමණ හා ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව බහුවාර්ගික සමාජයක් බවට පත්විය. ඉන්දියාවෙන් පැමිණි දමිළ ජාතිකයන් නිසා හිංදු සංස්කෘතිය ද, වෙළඳාම අරමුණු කොට ගෙන පැමිණි මුස්ලිම්වරුන් ගෙන් ඉස්ලාම් සංස්කෘතිය ද ආරම්භ වූ අතර යුරෝපීය ජාතින්ගේ ආගමනය හා ඔවුන්ගේ ප්‍රචාරණවාදී පිළිවෙත් නිසා කිතුණු සංස්කෘතිය ද ශ්‍රී ලංකාවේ ස්ථාපිත විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව බහු සංස්කෘතික දේශයක් බවට පත් විය. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් ලෙස හඳුන්වන්නේ එබැවිනි. සංස්කෘතිකමය වශයෙන් පවතින බහුවිධ භාවය නිසා සමාජ සහජීවනයක් ගොඩ නගා ගැනීම ශ්‍රී ලංකාව හමුවේ උද්ගත වන වැදගත් අවශ්‍යතාවක් වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. විවිධත්වය අගයමින් එකගතා ගොඩ නගා ගැනීමට සමත් වෙයි.
2. සෙසු සංස්කෘතීන්ට ගරු කිරීම මගින් සහජීවනයක් ඇති කර ගනි.

**ගුණාත්මක යෙදවුම්**

* පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය, නිර්මාණාත්මක පුවරු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* ශ්‍රී ලාංකික සමාජයේ සංස්කෘතික විවිධත්වය හඳුනා ගැනීමට මග පෙන්වන්න.
* ඒ අනුව ලාංකික සමාජයේ ඇති අනෙකුත් සංස්කෘති හඳුනා ගැනීමට හා ඒවායේ විශේෂතා පෙන්වා දීමට කටයුතු කරන්න.
* අන්තර් සංස්කෘතික සහයෝගීතාව ප්‍රදර්ශනය වන අවස්ථා පිළිබඳ සිසුන්ගේ දැනුම අවදි කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ආගම, භාෂාව වැනි කරුණු මත තමා අයත් සංස්කෘතිය තීරණය වන බව දක්වමින් පාඩමට ප්‍රවේශය සකස් කරගන්න. (ඇමුණුම 01) | සාකච්ඡා ක්‍රමය |
| පැවිදි සිසුවා සිංහල බෞද්ධ මහ සංස්කෘතියේ මෙන්ම පැවිදි උප සංස්කෘතියේ ද සමාජිකයෙකු බව අවබෝධ කර ගැනීමට මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| ශ්‍රී ලංකාව බහුසංස්කෘතික සමාජයක් වන බව අවබෝධ කර ගැනීමට මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| පන්තියේ සිසුන් කණ්ඩායම් 03කට බෙදා වෙන් කරන්න,<br>හිංදු සංස්කෘතිය<br>ඉස්ලාම් සංස්කෘතිය<br>ක්‍රිස්තියානි සංස්කෘතිය<br>යන තුනෙහි තොරතුරු රැස් කිරීමට එක් එක් කණ්ඩායමට පවරන්න. කණ්ඩායම රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න. අවශ්‍ය උපදෙස් හා ඌණ පූර්ණය කරන්න. | කණ්ඩායම් ක්‍රමය |
| බහු සංස්කෘතික සමාජයක පවත්වා ගත යුතු සංස්කෘතික සහජීවනයේ වැදගත්කම පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| අන්තර් සංස්කෘතික සහජීවනය සඳහා ක්‍රියා කළ පුද්ගලයන් කිහිප දෙනෙකු නම් කිරීමට සිසුන් යොමු කරන්න. | කේවල ක්‍රමය |
| අන්තර් සංස්කෘතික සහයෝගිතාව ප්‍රකට වන අවස්ථා කිහිපයක් හඳුන්වා දෙන්න. (ඇමුණුම 02 යොදාගන්න) | සාකච්ඡා ක්‍රමය |

ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ගුරුවරයාට අවස්ථාව ඇත.

**ඇගයීම හා තක්සේරුකරණය**

- ශ්‍රී ලංකික සමාජයේ ඇති අනෙකුත් සංස්කෘති දෙකක් නම් කරන්න.
- වෙනත් සංස්කෘති තුනකට අයත් ලක්ෂණ දෙක බැගින් වෙන වෙනම ලියන්න.
- ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියට හා අනෙකුත් සංස්කෘතිවලට අයත් ආගමික උත්සවය බැගින් ලියන්න.

✳ සංස්කෘතික සහජීවනය සඳහා ක්‍රියා කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

✳ ශ්‍රී ලංකික සමාජයේ සංස්කෘතික සහජීවනය පෙන්වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

ඇමුණුම 01

✳ මහ සංස්කෘතිය - කිසියම් රටක මහජාතියට නැතහොත් ප්‍රධාන ජනවර්ගයට අයත් සංස්කෘතිය

✳ උප සංස්කෘතිය - මහ සංස්කෘතිය නියෝජනය කරන අතරම වෙනත් සුවිශේෂී කරුණු මත නිර්මාණය වූ කුඩා සංස්කෘතියකි.

උප සංස්කෘතිය යන්න සමාජ විද්‍යා ශබ්ද කෝෂයෙහි ''ජාතික සංස්කෘතිය තුළ ඇති කුඩා ඒකකයක්'' යනුවෙන් නිර්වචනය කර ඇත.

✳ අන්‍ය සංස්කෘතිය - මහ සංස්කෘතියට අමතරව කිසියම් සමාජයක ඇති ප්‍රමාණයෙන් කුඩා වෙනත් ජනවර්ගික සංස්කෘතියකි.

✳ බහු සංස්කෘතිය - වාර්ගික විෂමතාව පදනම් කර ගත් සංස්කෘතීන් කිහිපයක් සහිත සමාජය

ඇමුණුම 02

✳ වෙසක් දිනයේ මුස්ලිම්වරුන් හා කිතුනුවන් දන්සල් පැවැත්වීම.

✳ නායයෑම්, ගංවතුර, සුනාමි ව්‍යසනය වැනි අවස්ථාවල වාර්ගික හෝ ආගමික භේදයකින් තොරව එකමුතුව ක්‍රියා කිරීම.

✳ බෞද්ධ උරුමයන් විනාශ වන අවස්ථාවල කිතුණු සමාජය ඒවා සුරැකීම වෙනුවෙන් හඬ නැගීම.

✳ දමිළ වතු කම්කරුවන්ගේ දරුවන් සිංහල පාසැල්වල අධ්‍යාපනය ලැබීම.

✳ සිංහල දරුවන්ට දමිළ බසත්, දමිළ දරුවන්ට සිංහල බසත් ඉගැන්වීමේ ප්‍රතිපත්තිය.

# 04. පුද්ගලයා හා සමාජය

**නිපුණතාව** - පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතාව හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම** - 4.1 සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධය පිළිබඳ තොරතුරු රැස් කර ඉදිරිපත් කරයි.

4.2 සමාජය යනු කුමක්දැයි හඳුන්වා දෙයි.

4.3. සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය අධ්‍යයනය කරයි.

4.4. බුදු දහමට අනුව සමාජ සබඳතා වර්ධනය කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 10 යි.**

**හැඳින්වීම -** සමාජයක් යනු සාපේක්ෂව ස්ථාවර සමාජ සම්බන්ධතා මගින් එකට ගොනු කළ සාමාජික එකතුවකි. එය නිර්මාණය කරන මූලික සාධකය සාමාජිකයා ය. සමාජය සාමාජිකයාට බලපෑම් කරනු ලබයි. සාමාජිකයා බොහෝ දේ සමාජයෙන් ඉගෙන ගනියි. උකහා ගනියි. එහි දී තමා අයත් සමාජයටත් බාහිර ලෝකයටත් ගැළපෙන ආකාරයට සාමාජිකයා සිය පෞරුෂය සකසා ගනී. සමාජයෙන් විවිධ අත් දැකීම් ලබන සාමාජිකයා අවස්ථානුරූපීව හැසිරෙන්නට සමත් වෙයි.

**නිපුණතාව -** පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතාව හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම -** 4.1 සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධය පිළිබඳ තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02** යි.

**ඉගෙනුම් පල**

1. පුද්ගලයා හා සාමාජිකයා අතර වෙනස වටහා ගනියි.
2. සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධතාවය හඳුනා ගෙන කටයුතු කරයි.
3. සමාජානුයෝජනය ඔස්සේ පුද්ගලයා සමාජීය සත්වයෙකු ලෙස ජීවත් වීමට අවැසි ගුණාංග වර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කරයි.

**හැඳින්වීම -** මිනිසා යනු සමාජ සත්වයෙකි. ඔහු/ඇය සමාජයේ කොටස්කරුවෙකි. යම් තැනැත්තෙකු ගෙදර දී දෙමාපියන් අභියස දරුවෙකි. සහෝදර සහෝදරියන් හමුවේ සහෝදරියකි. සිය අත්තම්මාට මුණුබුරෙකි. නැන්දා, මාමාට, බාප්පාට, පුංචි අම්මාට ඥාති පුත්‍රයෙකි. යහළු යෙහෙලියන් අතරේ යහළුවෙකි. ගුරුවරයා අභියස ශිෂ්‍යයෙකි. පන්සලේ දායකයෙකි. ගමේ දී ගම් වැසියෙකි. ඔබ සාමණේර නමක් නම් ලොකු හාමුදුරුවන්ට කීකරු ගෝලයෙකි. පැවිදි සහෝදර හිමිවරුන්ට පැවිදි සහෝදරයෙකි. යහළු හිමිවරුන්ට යහළුවෙකි. පිරිවෙණේ දී ශිෂ්‍යයෙකි. ගමේ දායකයන්ට පොඩි හිමි නමකි. මේ අනුව සාමාජිකයා සමාජය හා සමග සම්බන්ධ වී ඇති ආකාරය පැහැදිලි වෙයි. සමාජය ලෙස හඳුන්වනු ලබන්නේ මෙකී සම්බන්ධතා ජාලය මගින් ගොනු කරන ලද සාමාජික එකතුවයි.

සාමාජිකයා හා සමාජය අතර ඇති සම්බන්ධතාව ගැන කතා කරන විට සමාජානුයෝජනය ද වැදගත් ය. පුද්ගලයා සාමාජිකයෙකු බවට පත් කරනු ලබන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය මගිනි. ලොව කිසිම පුද්ගලයෙකු හට සමාජයේ සහයෝගය නොමැතිව සමාජීය සත්ත්වයෙකු බවට පත් විය නොහැකිය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. අන්‍යෝන්‍ය සම්බන්ධතා මාර්ගයෙන් සාමාජිකයා සමාජයේ සාමාජිකත්වයට පත්වන බවත්, විවිධ ආයතනවල කොටස් කරුවෙකු වන බවත් වටහා ගනියි.
2. සමාජිකයා සිය සමාජානුයෝජනයේ දී හොඳ නරක තේරුම් කර ගත යුතු බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

* වීඩියෝ දර්ශන, කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* පුද්ගලයා හා සාමාජිකයා වෙන් වෙන් වශයෙන් හඳුන්වා දෙන්න.
* පුද්ගලයා සමාජානුයෝජනය වන ආකාරය පැහැදිලි කරන්න.
* මුහුණ දෙන නව සමාජ අවස්ථාවන්ට අනුව සාමාජිකයාට නැවත නැවතත් අනුයෝජනය වීමට වුවමනා බව පෙන්වා දෙන්න.
* සාමාජිකයාට අවස්ථානුරූපීව විවිධ තත්ත්වයන් ආරෝපනය වන බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සිසුවෙකු පන්තිය ඉදිරියට ගෙන පුද්ගලයා හා සාමාජිකයා පිළිබඳව වෙන් වෙන්ව හඳුන්වා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය |
| පුද්ගලයෙකු සමාජානුයෝජනය වන ආකාරය පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| විටින් විට සාමාජිකයාට විවිධ තත්ත්වයන් දරන්නට වන බව උදාහරණ මගින් පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම් හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

* පුද්ගලයා හා සාමාජිකයා යන්න පැහැදිලි කරන්න.
* සමාජානුයෝජන කාරක (ආයතන) 05 ක් ලියන්න.

ඇමුණුම 1

කාර්ය පත්‍රිකා අංක 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. පුද්ගලයා හා සාමාජිකයා අතර වෙනස පෙන්වා දෙන්න.
02. එකම සාමාජිකයා විවිධ අවස්ථාවල දී විවිධ තත්ත්වයන් උසුලයි. උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

**නිපුණතාව -** පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතා හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම -** 4.2 සමාජය යනු කුමක් දැයි හඳුන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. ''සමාජය'' යන්න නිර්වචනය කරයි.
2. සමාජ වර්ගීකරණය හඳුනා ගෙන එහි ලක්ෂණ විස්තර කරයි.
3. ඒ ඒ සමාජවල ඇති සංස්කෘතික වටිනාකම් ඇගයීමට ලක් කරයි.

**හැඳින්වීම -** ''සමාජයක්'' යනු සාපේක්ෂව ස්ථාවර සමාජ සම්බන්ධතා මගින් එකට ගොණු කළ සාමාජික එකතුවකි. එමෙන්ම නිශ්චිත ප්‍රදේශයක නිශ්චිත කාලයක ජීවත්වන මිනිසුන් විසින් අන්‍යෝන්‍ය බැඳීම් මත ගොඩනඟා ගන්නා සංස්කෘතිකමය ඒකකය සමාජයක් ලෙස හැඳින්විය හැකි ය.

හුදු මිනිස් එකතුවක් සමාජ විද්‍යාවට අනුව සමාජයක් නොවේ. බස් රථයක, දුම්රියක, බස් නැවතුම් පොළක, දුම්රිය නැවතුම් පොළක මිනිස් එකතුවක් බොහෝ විට දැකිය හැකි ය. එහෙත් එවැනි තැනක් සමාජයක් නොවේ. සමාජයක් වීමට නම් මිනිසුන් අතර ස්ථාවර සම්බන්ධතා තිබිය යුතු ය. අන්‍යෝන්‍ය සබඳතාවල පදනම අන්තර් ක්‍රියාය.

ලෝකයේ තිබෙන විවිධ සමාජ වර්ග සමාජ විද්‍යාඥයින් ප්‍රධාන වර්ග තුනකට බෙදා දක්වා ඇත. එනම්,

01. ගෝත්‍රික සමාජය

02. ගැමි සමාජය

03. කාර්මික සමාජය යනුවෙනි.

එකී සමාජවල ගති ලක්ෂණ වෙන වෙනම අධ්‍යයනය කිරීමෙන් ඒ ඒ සමාජවල ස්වභාවය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* ප්‍රදර්ශන ක්‍රමය
* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ''සමාජය'' යන්න අර්ථ දක්වයි. සමාජ වර්ගීකරණය අවබෝධ කර ගනී.
2. එකිනෙක සමාජයට ආවේණික සුවිශේෂී ගුණාංග අගයයි.

**ගුණාත්මක යෙදවුම්**

* වීඩියෝ දර්ශන, විවිධ සමාජ දැක්වෙන පින්තූර, කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ සමාජයක් ගොඩ නැගෙන ආකාරය පෙන්වා දෙමින් ''සමාජය'' යන්න විවිධ නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.
- ✳ සමාජ විද්‍යාඥයින් පෙන්වා දුන් ප්‍රධාන සමාජ වර්ග තුන හඳුන්වා දෙන්න.
- ✳ එකී සමාජ වර්ග තුනේ ඇති ලක්ෂණ වෙන් වෙන්ව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- ✳ සමාජ වර්ගීකරණයේ දී සලකා බලන විශේෂ කරුණු හඳුන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| විවිධ සමාජ වර්ග දැක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට අවස්ථාව ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය |
| සමාජයක් ගොඩ නැගෙන ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ''සමාජය'' යන්න නිර්වචනය කිරීමට අදාළ තොරතුරු සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ වර්ගීකරණය හඳුන්වා දෙමින් එහි ලක්ෂණ වෙන වෙනම පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම් හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- ✳ ''සමාජය'' යන්න හඳුන්වන්න.
- ✳ ලෝකයේ තිබෙන ප්‍රධාන සමාජ වර්ග මොනවාද?
- ✳ එම සමාජ වර්ග තුන කෙටියෙන් හඳුන්වන්න.

**ඇමුණුම 01**

කාර්ය පත්‍රිකා අංක 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ''සමාජය'' යන්න සඳහා නිර්වචනයක් ගොඩ නගන්න.

02. ලෝකයේ පවතින ප්‍රධාන සමාජ වර්ග ලියන්න.

03. ඒ එක් එක් සමාජ වර්ගය හඳුනා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**නිපුණතාව** - පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතාව හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම** - 4.3 සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය හඳුනා ගනියි.
2. විවිධ ආයතනවලින් ඉටුවන කාර්යභාරය විස්තර කරයි.
3. සමාජ විවිධත්වය හා සමාජ සංකීර්ණත්වය හඳුනා ගෙන ඒ අනුව කටයුතු කරයි.

**හැඳින්වීම** - සෑම සමාජයක් ම එක හා සමාන නැත. එක් එක් සමාජය එකිනෙකින් වෙනස් වේ. එකම සමාජය තුළ ද විවිධත්වයක් ඇත. උදාහරණයක් ලෙස ගෝත්‍රික සමාජයේ ප්‍රධාන ජීවනෝපාය දඩයම් කිරීම වන අතර බෞද්ධ සමාජය සතුන් මැරීම පාප කර්මයක් ලෙස සලකයි. බෞද්ධ සමාජය තුළ ද ගිහි හා පැවිදි වශයෙන් වෙනස්කම් පවතී. ගිහි හා පැවිදි සමාජ දෙක එකිනෙකින් වෙනස් වන්නේ චර්යාමය වශයෙන් ය.

සමාජයක් තුළ විවිධ ආයතන තිබේ. පවුල, පන්සල, පාසල, රැකියා ස්ථානය, පොලීසිය යනාදී වශයෙන් ආයතන රාශියක් ඇත. මේ එක් එක් ආයතන සමග අනෙකුත් ආයතන සම්බන්ධ වී ඇත. එකකින් ඉටු කරනු ලබන සේවය අනෙක් ආයතනයට වැදගත් වේ. සමාජයක පවතින මෙම ජාලාකාර සම්බන්ධතා රටාව නිසා ''සමාජය'' යනු සංකීර්ණ ඒකකයක් ලෙස හඳුන්වනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විවිධත්වය හා සංකීර්ණත්වය සමාජ ස්වභාවය බව අවබෝධ කර ගනියි.
2. එකී සමාජය තුළ සාර්ථකව ජීවත් වීමට අවැසි ගුණාංග වර්ධනය කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- අපට සහය වන එක් එක් ආයතන සමග අන්තර් ක්‍රියා කරන අයුරු දැක්වෙන රූප සටහන් චිත්‍ර, වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ විවිධත්වය පැහැදිලි කර දෙන්න.
- සමාජ විවිධත්වය සමඟ සංකීර්ණත්වයක් ද නිර්මාණය වන බව පෙන්වා දෙන්න.
- සමාජයේ පවතින විවිධ ආයතන හඳුන්වා දෙමින් ඒවායේ කාර්යභාරය පැහැදිලි කර දෙන්න.
- ඒ එක් එක් ආයතනය පෙරළා අනෙකට සම්බන්ධ වන බව උදාහරණ මගින් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විවිධත්වය දැක්වෙන වීඩියෝ දර්ශන නැරඹීමට අවස්ථාව ලබා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡාවක යෙදෙන්න.<br>● සමාජ විවිධත්වය<br>● සමාජ සංකීර්ණත්වය | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

✳ සමාජ විවිධත්වය යන්න අර්ථ දක්වන්න.

✳ දෛනික ජීවිතයේ දී ඔබ ගණුදෙනු කරනු ලබන සමාජ ආයතන 3 ක් ලියන්න.

**ඇමුණුම 01**

කාර්ය පත්‍රිකා අංක 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ඔබ දන්නා සමාජ ආයතනයක් දක්වා එහි කාර්ය භාරය ලියන්න.

02. එදිනෙදා ජීවිතයේ දී අපහට හමුවන ආයතන ඇතුළත් සංකල්ප සිතියමක් සකසන්න.

**නිපුණතාව -** පුද්ගලයා හා සමාජය අතර අන්තර් සබඳතාව හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම -** 4.4 බුදු දහමට අනුව සමාජ සබඳතා වර්ධනය කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ දී බුදු දහමේ සඳහන් සූත්‍ර ධර්ම ඉවහල් කර ගත හැකි අයුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
2. යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා බෞද්ධ ධර්ම මාර්ගයෙහි පිහිටා කටයුතු කරයි.

**හැඳින්වීම -** සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමෙන් යහපත් පරාර්ථකාමී සමාජයක් ගොඩනගා ගත හැකි ය. මෙලොව පරලොව දියුණුවට හේතු වන ප්‍රතිපත්ති රාශියක් බුද්ධ දේශනාවෙහි අන්තර්ගතව ඇත. සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීමේ දී යහපත් වූ සමාජානුයෝජනයක වැදගත්කම ද අවධාරණය කරනු ලැබේ. ඒ සඳහා බුදුදහමෙන් ලැබෙන පිටුවහල ඉතා විශාලය.

- සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරය
- සිගාලෝවාද සූත්‍රයේ සතර සංග්‍රහ වස්තුව
- සප්ත අපරිහානීය ධර්ම සහ දසරාජ ධර්ම
- මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු
- පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු කරුණු
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව පරලොව දියුණුවට හේතු වන කරුණු
- කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් කරණීය හා අකරණීය ධර්ම
- කාලාම සූත්‍රයේ දැක්වෙන නිදහස් චින්තනය
- පංචශීල ප්‍රතිපදාව

යනාදිය දැක්විය හැකි ය. යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා ඉහත සඳහන් බෞද්ධ ඉගැන්වීම්වල වැදගත්කම හඳුනා ගෙන කටයුතු කිරීම වැදගත් වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ✳ ප්‍රදර්ශන ක්‍රමය
- ✳ සාකච්ඡා ක්‍රමය
- ✳ කණ්ඩායම් ක්‍රමය
- ✳ ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. යහපත් සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ඇවැසි බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණු අධ්‍යයනය කිරීමට නිරතුරුව පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- ✳ කාර්ය පත්‍රිකා
- ✳ සූත්‍ර දේශනා ඇතුළත් ත්‍රිපිටක පොත්

✳ සිංහල අනුවාද ඇතුළත් සූත්‍ර ග්‍රන්ථ

✳ ධර්ම ග්‍රන්ථ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

✳ පහත සඳහන් සූත්‍ර ගත ධර්ම කරුණු ඇසුරු කිරීමෙන් යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න.

සූත්‍ර

- සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරය
- සිගාලෝවාද සූත්‍රයේ සතර සංග්‍රහ වස්තු
- මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු
- පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ එන මෙලොව පරලොව දියුණුවට හේතුවන කරුණු
- කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන කරණීය හා අකරණීය ධර්ම
- කාලාම සූත්‍රයේ දැක්වෙන නිදහස් චින්තනය
- දසරාජ ධර්මය
- සප්ත අපරිහානීය ධර්ම
- පංචසීල ප්‍රතිපදාව

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සූත්‍ර හා ධර්ම කරුණු ඇතුළත් පොත් ප්‍රදර්ශනය කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| සිසුන් සමග ඒවායෙහි අන්තර්ගත කරුණු සොයා වෙන් වෙන්ව පෙළ ගස්වන්න. | පරීක්ෂණ ක්‍රමය |
| පෙළ ගස්වන ලද කරුණු එකින්නෙක යහපත් සමාජ සම්බන්ධතා ඇති කිරීමට මග පෙන්වන අයුරු පහදන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

✳ සදිසා නම් කරන්න.

✳ සතර සංග්‍රහ වස්තු මොනවාද?

* සප්ත අපරිහානීය ධර්ම අතරින් තුනක් ලියන්න.
* දසරාජ ධර්මවලින් හතරක් ලියන්න.
* මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු හතරක් ලියන්න.
* පහත සඳහන් සූත්‍ර ධර්මයක් ඇසුරෙන් යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ඉවහල් වන කරුණු පැහැදිලි කරන්න.
  - සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන වගකීම් හා යුතුකම්
  - පරාභව සූත්‍රය
  - ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

**ඇමුණුම 01**

කාර්ය පත්‍රිකා අංක 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට මග පෙන්වන බුදු දහමේ සඳහන් සූත්‍ර හතරක් ලියා දක්වන්න.

02. පංචසීල ප්‍රතිපදාව ආරක්ෂා කර ගැනීමෙන් යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය වන අයුරු පැහැදිලි කරන්න.

## 05. සමාජ පාලනය

නිපුණතාව - සමාජයේ යහ පැහැත්ම උදෙසා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් ඒ සඳහා දායකත්වය සපයයි.

නිපුණතා මට්ටම - 5.1 සමාජ පාලනයෙහි අවශ්‍යතාව අවබෝධ කර ගනියි.

5.2 අවිධිමත් හා විධිමත් සමාජ පාලනය සිදුවන ආකාරය විමර්ශනය කරයි.

5.3 පිරිවෙන හා පන්සල මගින් සමාජ පාලනය උදෙසා ඉටු කරන කාර්යභාරය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 10

හැඳින්වීම - පොදු අරමුණු මත පදනම් වූ සමාජ සම්බන්ධතාවලින් ගොනු කරන ලද සමූහයක් ''සමාජයක්'' ලෙස අර්ථ කථනය වේ. එකී සමාජයේ සමබර පැවැත්ම උදෙසා සමාජ පාලනය අත්‍යාවශ්‍ය වේ. සරල සමාජවල සිට සංකීර්ණ සමාජ දක්වාම සමාජ පාලනය ක්‍රියාත්මක වෙයි. මේ අනුව පොදු සමාජ පර්යාය ආරක්ෂා කර ගැනීමට මෙන් ම අපගාමිත්වය වළක්වා ගැනීමට ද අනෙක් අතින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික සංවර්ධනය සඳහා ද ''සමාජ පාලනය'' මගින් ඉටු කරනු ලබන කාර්යභාරය ඉතා විශාල බව තහවුරු වේ.

නිපුණතාව - සමාජයේ යහ පැවැත්ම උදෙසා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් ඒ සඳහා දායකත්වය සපයයි.

**නිපුණතා මට්ටම -** 5.1 සමාජ පාලනයෙහි අවශ්‍යතාව අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. ''සමාජ පාලනය'' යන්න හඳුනා ගනියි.
2. සමාජ පාලනයෙහි අවශ්‍යතාව පැහැදිලි කරයි.
3. සමාජ පාලනය සඳහා දායකත්වය සැපයීමෙන් අත්වන ප්‍රයෝජන පෙන්වා දෙයි.

**හැඳින්වීම -** සමාජයෙහි ජීවත් වන සාමාජිකයාගේ අවශ්‍යතාවන් පුද්ගලික හා සමාජීය යනුවෙන් කොටස් දෙකකි. සාමාජිකයාට සිය අභිප්‍රායයන් තමා සිතන ආකාරයෙන්ම ඉටුකර ගැනීමට නොහැකි වීම සමාජ ස්වභාවය යි. පුද්ගල හා සමාජීය අවශ්‍යතා සපුරා ගනිමින් සමාජ පර්යාය පවත්වා ගැනීමට නම් සමාජයේ ජීවත් වන සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් තිබිය යුතු ය. යම් තැනැත්තෙකු අන් අයගේ අපේක්ෂාවන් ගැන සැලකිල්ලට ගෙන ජීවත් වනුයේ එසේ නොවුනහොත් සමාජ ජීවිතය ව්‍යාකූල වන බැවිනි. සමාජ ජීවිතය ව්‍යාකූලත්වයට පත් වීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ සමස්ත සමාජය බිඳ වැටීමයි. එහෙයින් යහපත් අන්තර් සම්බන්ධතා පවත්වා ගනිමින් එකිනෙකා හොබවන තත්ත්වය, කාර්ය කොටස්, යුතුකම්, වගකීම්, පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීමට අවැසි සමාජ පසුබිම ආරක්ෂා කර ගැනීම වැදගත් වේ. ඒ සඳහා සමාජ පාලනයෙහි අවශ්‍යතාව ඉස්මතු වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ඉදිරිපත් කිරීම
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජය නිසි ලෙස පවත්වා ගැනීම සඳහා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් අදහස් දක්වයි.
2. සමාජ පාලනය අවබෝධ කරගනිමින් නිරතුරුව ම ඊට දායකත්වය සපයයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාඩමට අදාළ පින්තූර
- ලියන කඩදාසි, පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජය තුළ ක්‍රමානුකූල බව සහ සාමය ගොඩ නැගීම උදෙසා සමාජ පාලනයෙහි ඇති අවශ්‍යතාවය පෙන්වා දෙන්න.

* සමාජ පාලනය මගින් සාමාජිකයාගේ නිදහස සහ ස්වාධීනත්වය ආරක්ෂා වන අයුරු සාකච්ඡා කරන්න.
* සංස්කෘතිය ආරක්ෂා කර ගැනීම සඳහා සමාජ පාලනය ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.
* ආර්ථික, සමාජීය සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා සමාජ පාලනය දායකවන අයුරු සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පිවිසීම : පිරිවෙන් සිසුන්ගේ පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න. එයින් ගම්‍ය වන අදහස් සාකච්ඡා කරන්න. (නිල ඇඳුම්, ලාංඡන පැළඳ සිටින ආකාරය හිස පීරා තිබෙන අයුරු) | ඉදිරිපත් කිරීම |
| මෙයින් ඇති වන ක්‍රමානුකූල බව හා සංවිධානාත්මක බව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර පහත සඳහන් මාතෘකා බෙදා දෙන්න.<br>පවුල, පාසල, පන්සල, රැකියා ස්ථානය, ක්‍රීඩා උත්සවය<br>ඉහත මාතෘකා යටතේ සමාජ පාලනය ක්‍රියාත්මක වන ආකාරය ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

* සමාජ පාලනය අවශ්‍ය වන්නේ මන් ද යන්නට හේතු දෙකක් දක්වන්න.
* සමාජ පාලනය ඉක්මවා යෑමෙන් සිදුවන හානි දෙකක් දක්වන්න.
* සමාජ පාලනය සඳහා දායකත්වය සැපයිය හැකි ආකාර දෙකක් දක්වන්න.
(ලිඛිත හෝ වාචික පිළිතුරු ඇගයීමට ලක් කරන්න. සුදුසු නිර්ණායක යටතේ අගයන්න.)

**නිපුණතාව** - සමාජයේ යහ පැහැත්ම උදෙසා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් ඒ සඳහා දායකත්වය සපයයි.

**නිපුණතා මට්ටම** - 5.2 අවිධිමත් හා විධිමත් සමාජ පාලනය සිදුවන ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. විධිමත් හා අවිධිමත් සමාජ පාලනය බෙදා දක්වයි.
2. අවිධිමත් සමාජ පාලන කාරක යටතේ සිරිත් විරිත්, ධර්මතා, විශ්වාස, සම්ප්‍රදායයන් හා සාරධර්ම යන කරුණු උදාහරණ මගින් පැහැදිලි කරයි.
3. චාරිත්‍ර වාරිත්‍ර සමාජය තුළ පිළිගැනීමේ හා ක්‍රියාත්මක වීමේ ස්වභාවය අනුව වර්ගකර දක්වයි.
4. ව්‍යවස්ථාපිත නීතිය යනු කුමක් දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරයි.

හැඳින්වීම - සමාජ සම්මත සිරිත් විරිත් හා නිතී රීති පද්ධතිය සමාජ පාලනයේ පදනම වේ. මෙකී පදනම සක්‍රීය වන විට විධිමත් සහ අවිධිමත් සමාජ පාලනය ද සක්‍රීය වේ. සම්ප්‍රදායන්, සිරිත්විරිත්, විශ්වාස, ඇදහිලි, සාරධර්ම, අගයන් අවිධිමත් සමාජ පාලන කාරක වන අතර ව්‍යවස්ථාපිත 'නීතිය' විධිමත් සමාජ පාලන කාරකයක් ලෙස ද හැඳින් විය හැකි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* කේවල ක්‍රමය හෝ කණ්ඩායම් ක්‍රමය
* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. සිරිත් විරිත්, සම්ප්‍රදායන්, ධර්මතා ආදි අවිධිමත් සමාජ පාලන කාරක, සමාජ පාලනයෙහිලා ක්‍රියාකරන අයුරු පෙන්වා දෙමින් ඇගයීමට ලක්කරයි.
2. සමාජ පාලනය උදෙසා පොදු සාරධර්ම පද්ධතියක වටිනාකම සාකච්ඡා කරයි.
3. නිතීයේ ආධිපත්‍යය සමාජ පාලනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

* වැඩ සටහන් න්‍යාය පත්‍ර
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිටපත්
* ලියන කඩදාසි, පෑන්, පැන්සල්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* අවිධිමත් සමාජ පාලන කාරක හඳුන්වා දෙමින් පැහැදිලි කරන්න.
* සමාජ පිළිගැනීම හා ක්‍රියාත්මක වීමේ ස්වභාවය අනුව චාරිත්‍ර වාරිත්‍ර වර්ග කර හඳුන්වා දෙන්න.

✳ සාරධර්ම හා ඇගයුම් අතර සම්බන්ධය පැහැදිලි කර දෙන්න.

✳ විධිමත් සමාජ පාලන කාරක සවිස්තරාත්මකව පෙන්වා දෙන්න.

✳ සමාජ පාලන කාරකවලට අනුගත නොවීමෙන් සමාජ ව්‍යාකූලතාවය ඇතිවන ආකාරය සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පිවිසීම : වැඩ සටහන්, න්‍යාය පත්‍ර සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා පිටපත් සිසුන්ට නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න. | කේවල හෝ කණ්ඩායම් ක්‍රමය |
| ඒවායෙහි අවශ්‍යතාව සිසුන් හා සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර පහත සඳහන් මාතෘකා බෙදා දෙන්න.<br>පිරිවෙනේ උදෑසන රැස්වීම.<br>පිරිවෙනේ පරිපාලන ව්‍යුහය.<br>අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර.<br>විවාහ සිරිත් විරිත්.<br>මැතිවරණ දිනය | කණ්ඩායම් ඉදිරිපත් කිරීම |
| සෑම කණ්ඩායමකට ම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත මාතෘකා යටතේ කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව ලබා දෙන්න.<br>• එම අවස්ථාව සංවිධානය වී ඇති ආකාරය.<br>• ඒවා කෙරෙහි විධිමත්, අවිධිමත් සමාජ පාලනය මැදිහත් වී ඇති අයුරු,<br>• ඒවායේ තිබෙන වැදගත්කම | කණ්ඩායම් ඉදිරිපත් කිරීම<br><br>සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

✳ අවිධිමත් සමාජ පාලන කාරක හතරක් දක්වන්න.

✳ ජනචර්යා සහ ගණචර්යා උදාහරණ දෙකක් බැගින් ගෙන පැහැදිලි කරන්න.

✳ නීතිය ක්‍රියාත්මක වීමේ දී අවධානය යොමු කරන මූලික ලක්ෂණ තුනක් නම් කරන්න.

✳ ජන සමාජයක යහපත සඳහා පොදු සාරධර්ම පද්ධතියක් ගොඩ නගන්න.

✳ නීතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ තුනක් දක්වන්න. (සුදුසු නිර්ණායක යටතේ අගයන්න).

**නිපුණතාව** - සමාජයේ යහ පැහැත්ම උදෙසා සමාජ පාලනයෙහි අවශ්‍යතාව පිළිගනිමින් ඒ සඳහා දායකත්වය සපයයි.

**නිපුණතා මට්ටම -** 5.3 පිරිවෙණ හා පන්සල මගින් අවට සමාජයේ සමාජ පාලනය උදෙසා කරනු ලබන කාර්යභාරය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 04 යි.

**ඉගෙනුම් පල**

1. පිරිවෙන හා පන්සල සමාජයේ යහ පැවැත්ම සඳහා ක්‍රියාකරන ආකාරය පෙන්වා දෙයි.
2. බුද්ධ කාලීන සමාජයේ පැවති සමාජ පාලන උපක්‍රම විස්තර කරයි.
3. යහපත් පැවැත්ම සඳහා හේතුවන බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරයි.
4. සමාජ පාලනයෙහිලා භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන කාර්යභාරය පැහැදිලි කරයි.
5. එහි ලා තමන්ට ද වගකීමක් භාර වන බව පෙන්වා දෙයි.

**හැඳින්වීම -** ශ්‍රී ලාංකික සමාජයේ බල පවත්වන සමාජ හර පද්ධතිය ගොඩ නැංවීමේ දී බුදු දහමින් ලැබුණු බලපෑම සුවිශේෂී වේ. මිහිඳු මාහිමියන්ගේ ලංකා ගමනයත් සමගින් ගොඩ නැගුණු බෞද්ධ සමාජයෙහි කේන්ද්‍රස්ථානය පන්සල විය. එතැන් පටන් පන්සල ආගමික මධ්‍යස්ථානය හැටියට මෙන් ම අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක විය. මෙහි දී බෞද්ධෝපදේශ පෙරදැරි කර ගත් භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය ශ්‍රී ලාංකික සමාජයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ අධ්‍යාත්මික සංවර්ධනයට සුවිශාල පිටුබලයක් වූයේ ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා මණ්ඩපයක් පැවැත්වීම.

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ පාලනයෙහිලා පිරිවෙණ හා පන්සල ක්‍රියා කරන ආකාරය අගයයි.
2. බෞද්ධාගමික ඉගැන්වීම් ඇසුරින් භික්ෂූන් වහන්සේගෙන් ඉටු වන කාර්යභාරය සමාජ ප්‍රගතිය සඳහා ඉවහල් වන අයුරු පෙන්වා දෙයි.
3. බුදු දහමට අනුගත භික්ෂු චර්යාව පරිසර හිතකාමී බව පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

* ධම්ම පදය, සූත්‍ර ඇතුළත් ධර්ම ග්‍රන්ථ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* මහින්දාගමනයෙන් ඔප් නැංවුණු ශ්‍රී ලාංකික සමාජය පිළිබඳ සාකච්ඡාවකට යොමු වන්න.
* යහපත් සමාජයක් ගොඩ නැගීමට හේතු වන ධර්ම කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් දැනුවත් කරන්න.

* අතීතය සහ වර්තමානය පිළිබඳව අවධානය යොමු කරමින් අනාගත සමාජ පාලනයෙහිලා භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය කවරාකාර විය යුතු දැයි සාකච්ඡා කරන්න.

* බුදු දහමට අනුව භික්ෂු චර්යාව හැඩගස්වා ගැනීමෙන් පරිසර හිතකාමී බව ආරක්ෂා වන ආකාරය පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ''අතීත, වර්තමාන, අනාගත සමාජ පාලනයෙහිලා භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය'' යන මාතෘකාව යටතේ සාකච්ඡා මණ්ඩපයක් ගොඩ නගන්නට අවස්ථාව දෙන්න.<br><br>කණ්ඩායම් වශයෙන් සාකච්ඡාවට සහභාගි වීමට සිසුන්ට අවස්ථාව දෙන්න. සාකච්ඡාව මෙහෙය වීමට සිසුන් අතරින් කෙනෙකු තෝරා ගැනීමට ඉඩ ලබා දෙන්න.<br><br>අනෙක් සියලුම සිසුන්ට ප්‍රේක්ෂකාගාරයක ලෙස ප්‍රශ්න ඇසීමට, අදහස් දැක්වීමට හා පිළිතුරු දීමට අවස්ථාව දෙන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

* භික්ෂු සමාජයේ පාලනය උදෙසා භික්ෂුවක් විසින් අනුගමනය කළ යුතු වත් පිළිවෙත් පහක් සඳහන් කරන්න.

* යහපත් ගිහි සමාජයක් ගොඩ නැගීම සඳහා භික්ෂු සමාජය විසින් ඉටු කළ යුතු සේවාවන් පහක් ලියන්න.

* බුදු දහමින් ඉගැන්වෙන නායකත්ව ගුණාංග පහක් ලියන්න.

* සමාජ පාලනයෙහිලා දායකත්වය සපයන මහා මංගල සූත්‍රයෙහි දැක්වෙන කරුණු හතරක් දක්වන්න.

(සුදුසු නිර්ණායක යටතේ අගයන්න).

# 06. සමාජ ගැටලු

**නිපුණතාව** - සමාජ ගැටලු හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම** - 6.1 සමාජ ගැටලුවක් යන්න හඳුනා ගනී.

6.2 සමාජ ගැටලු වර්ගීකරණය කර ඒවාට බලපාන හේතු පැහැදිලි කරයි.

6.3 සමාජ ගැටලුවලින් සමාජයට වන බලපෑම ගවේෂණය කරයි.

6.4 සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 10 යි.**

හැඳින්වීම - සම්පූර්ණයෙන් ගැටලු විරහිත සමාජයක් සොයා ගත නොහැකි බව සමාජ විද්‍යාඥයන්ගේ මතයයි. ප්‍රාථමික නවීන, දියුණු නොදියුණු, ලොකු කුඩා, සරල හා සංකීර්ණ යන සෑම සමාජයකින්ම අඩු වැඩි වශයෙන් ගැටලු වාර්තා වේ. සියලු ගැටලු නිර්මාණය වන්නේ සමාජමය හේතු සාධකවල ප්‍රතිඵලයක් ලෙස බව ද සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දෙනු ලැබේ.

**නිපුණතාව** - සමාජ ගැටලු හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම -** 6.1 සමාජ ගැටලුවක් යන්න හඳුනා ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව 02 යි.**

**ඉගෙනුම් පල**

1. 'සමාජ ගැටලු' යන්න අර්ථ දක්වයි.
2. සමාජ ගැටලු හඳුනා ගෙන නම් කරයි.
3. සමාජ ගැටලු වර්ගීකරණය කර දක්වයි.

**හැඳින්වීම -** යම් සමාජයක ජීවත් වන සාමාජිකයන් එම සමාජයේ බල පවත්වන සිරිත් විරිත්, නිතී රීතිවලට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගැටලු ඇති වේ. එමෙන්ම සමාජය තුළ පැන නගින යම් ගැටලුවකට සමාජමය මැදිහත් වීමකින් පිළියම් යොදා ගත හැකි වන්නේ නම් එය සමාජ ගැටලුවක් ලෙස ඉතා සරලව විග්‍රහ කළ හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* ඉදිරිපත් කිරීමේ ක්‍රමය, සාකච්ඡා ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විසංවිධානයෙහි ප්‍රතිඵලයක් ලෙස සමාජ ගැටලු හට ගන්නා බව වටහා ගනියි.
2. සමාජ ගැටලුවක් හඳුනා ගැනීමට සමත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

* වීඩියෝ දර්ශන
* කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* ''සමාජ ගැටලුව'' යන්න පැහැදිලි කර දෙන්න.
* අප අවට සමාජයේ ඇති සමාජ ගැටලු පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
* ඕනෑම සමාජයක ඇති වන ආචාර ධර්ම/නීතිය බිඳ වැටීම හේතු කොට ගෙන සමාජ ගැටලු හට ගන්නා බව පෙන්වා දෙන්න.
* සිසුන්ගෙන් ලබා ගත් තොරතුරු අනුසාරයෙන් සමාජ ගැටලු පිළිබඳ නිර්වචනයක් ගොඩ නගන්න.
* සමාජයේ සුලභව දැකිය හැකි සමාජ ගැටලු කිහිපයක් ගෙන පැහැදිලි කර දෙන්න
    - » මදිරාබාධය
    - » කසළ කළමනාකරණ ගැටලුව
    - » දුප්පත්කම
    - » වකුගඩු රෝගය
    - » ළමා අපයෝජනය

ඒ එක් එක් ගැටලුවට පදනම් වන සමාජ සාධක පෙන්වා දෙන්න.

✳ සමාජ ගැටලුවක් උදාහරණ මගින් පෙන්වා දී එය අනෙකුත් ගැටලු නිර්මාණය ඉවහල් වන බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ ගැටලු දැක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට අවස්ථාව ලබා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ඒවායෙහි දැක්වෙන සමාජ ගැටලු පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලුවක් යන්න නිර්වචනය කිරීමට සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ලොව පවතින සමාජ ගැටලු කිහිපයක් සිසුන් සමග සාකච්ඡා කර වර්ගීකරණය කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කාණ්ඩායම් ක්‍රමය |
| පංතියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

✳ සමාජ ගැටලු යන්න අර්ථ දක්වන්න.

✳ ඔබ දන්නා සමාජ ගැටලු 05 ක් ලියන්න.

✳ තෝරාගත් සමාජ ගැටලුවක් සඳහා නිර්වචනයක් සකසන්න.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව : 01**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

01. ලෝකයේ පවතින සමාජ ගැටලු වර්ගීකරණ කර දක්වන්න.
02. පහත සඳහන් ගැටලුවක් ගෙන එය සමාජ ගැටලුවක් වන ආකාරය පැහැදිලි කරන්න.

i. මදිරාබාධය
ii. දූප්පත්කම
iii. ළමා අපයෝජනය
iv. කසළ කළමනාකරණ ගැටලුව
v. වකුගඩු රෝගය

**නිපුණතාව** - සමාජ ගැටලු හඳුනා ගැනීම.

**නිපුණතා මට්ටම -** 6.2 සමාජ ගැටලු වර්ගීකරණය කර ඒවාට බලපාන හේතු පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලු හඳුනා ගෙන ඒවා ඇතිවීමට බලපාන හේතු වෙන් කර දක්වයි.
2. එම ගැටලු විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**හැඳින්වීම -** පොදු සම්මතය උල්ලංඝනය කිරීම, නොතකා හැරීම හෝ ඉක්මවා යාම එම සමාජ පිළිවෙළ හෙවත් සමාජ පර්යාය (Social Order) ව්‍යාකූල වීමට හේතුවක් වේ. එහි දී සිදු වන්නේ සමාජය විසින් හොඳ යයි අනුමත කර පිළිගත්තා වූ හර පද්ධතිය බිඳවැටීමයි. සමාජ ගැටලු (Social Problems) යනු ව්‍යාකූලත්වයට පත් වූ සමාජයක දැකිය හැකි සාමාන්‍ය තත්ත්වයකි. සමාජය යළිත් සාමාන්‍ය තත්ත්වයට පත් කර ගත යුතුය. ඒ සඳහා කළ යුතු වන්නේ සමාජ ගැටලු නිවාරණය කර ගැනීමයි. කිසියම් ගැටලුවක් සමාජ ගැටලුවක් වීමට නම් පහත සඳහන් ගති ලක්ෂණ එයින් ප්‍රකට විය යුතුය.

1. සමාජ ගැටලුවක් කෙනෙකුට දෙදෙනෙකුට නොව බහුතර පිරිසකට බලපෑම් කරයි.
2. සමාජ ගැටලු සමාජය විසින්ම නිර්මාණය කර ගනු ලැබේ.
3. සමාජ ගැටලු සමාජ පැවැත්මට හානිකර වේ.
4. සමාජ ගැටලු පිළිබඳ සමාජයේ වැඩි දෙනෙකු සංවේදී වීම.
5. සමාජ ගැටලු සඳහා පිළියම් යෙදීමේ හැකියාව සමාජයට ම ඇත.

මෙම පාඩමේ දී අවධාරණය කරනු ලබන සමාජ ගැටලු පහකි.

01. මදිරාබාධය
02. දුප්පත්කම
03. ළමා අපයෝජනය
04. කසළ කළමනාකරණ ගැටලුව
05. වකුගඩු රෝගය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලු හා ඒවාට බලපාන සමාජමය හේතු ඇති බව අවබෝධ කර ගැනීම.
2. සමාජ ගැටලු සඳහා විසඳුම් ඇති බව සාකච්ඡා කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ ගැටලු කිහිපයක් පෙන්වා දෙන්න.
- සමාජ ගැටලුවලට බලපාන හේතු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කරන ලද කරුණු පිළිවෙලට පෙළ ගස්වන්න.
- පෙළ ගස්වන ලද හේතු එකිනෙක සමාජ ගැටලුවක් අනුසාරයෙන් පැහැදිලි කර දෙන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ ගැටලු දැක්වෙන වීඩියෝ දර්ශනයක් ප්‍රදර්ශනය කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| එම ගැටලු පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා කළ හැකි දේ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සාකච්ඡා කරන ලද කරුණු පිළිවෙලට පෙළ ගස්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| සමාජ ගැටලුවලට බලපාන හේතු උදාහරණ මගින් සාකච්ඡා කරන්න. විසඳුම් සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- සමාජ ගැටලුවලට බලපාන හේතු නම් කරන්න.
- ළමා අපයෝජනය සමාජ ගැටලුවක් වන ආකාරය පැහැදිලි කරන්න.
- ඔබ සාකච්ඡා කළ සමාජ ගැටලුවකට ලබා දිය හැකි විසඳුම් දෙකක් සඳහන් කරන්න.

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව : 01**

පහත සඳහන් එක් එක් කණ්ඩායමට අදාළ ගැටලුවට බලපාන හේතු සාධක වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

A - කණ්ඩායම : ළමා අපයෝජනය

B - කණ්ඩායම : කසළ කළමනාකරණ ගැටලුව

C - කණ්ඩායම : වකුගඩු රෝගය

**නිපුණතාව** - සමාජ ගැටලු හඳුනා ගැනීම.

නිපුණතා මට්ටම - 6.3 සමාජ ගැටලුවලින් සමාජයට වන බලපෑම ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 02 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලුවලින් සමාජයට වන බලපෑම පැහැදිලි කරයි.
2. සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා සාමාජිකයාට මැදිහත් විය හැකි බව ප්‍රකාශ කරයි.

**හැඳින්වීම** - දෙන ලද සමාජ ගැටලු නිර්මාණය වන ආකාරය හා එහි දී සමාජයේ මැදිහත් වීම තේරුම් ගනු ලබයි. සමාජය විසින් නිර්මාණය කර ගනු ලබන සමාජ ගැටලු දෙවනුව සමාජයේ සාමාන්‍ය පැවැත්ම අභියෝගයට ලක් කරන ආකාරය තේරුම් ගැනීමට සමත් වෙයි. එමෙන් ම එක් සමාජ ගැටලුවක ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් ලෙස තවත් විවිධ ගැටලු රැසක් උපත ලබන ආකාරය ද දැක ගැනීමට හැකි වේ. ඒ සියල්ලෙහි බලපෑම පොදුවේ සමාජ ජීවිතයට හානිකර වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* ප්‍රදර්ශන ක්‍රමය
* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. එක් සමාජ ගැටලුවක් මගින් තවත් සමාජ ගැටලු නිර්මාණය කරන බව හඳුනා ගනියි.
2. සමාජ ගැටලු හඳුනා ගෙන තම ජීවිතය නිවැරදි කරගැනීමට ක්‍රියා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* වීඩියෝ දර්ශන.
* පුවත් පත් දැන්වීම්.
* කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* සමාජ ගැටලු සම්බන්ධව ඇති පුවත් පත් දැන්වීම් කියවීමට සැලැස්වීම හෝ රූපවාහිනී වෙළඳ දැන්වීම් සමාජ ගැටලු ඇති වීමට මග පාදන ආකාරය පැහැදිලි කරන්න.
* එක් සමාජ ගැටලුවක් තවත් සමාජ ගැටලු නිර්මාණය වීමට හා වර්ධනයට බලපාන ආකාරය පෙන්වා දෙන්න.
* සමාජ ගැටලු මගින් සමාජයට වන බලපෑම උදාහරණ දෙමින් පැහැදිලි කර දෙන්න.
* දුප්පත්කම සමාජ ගැටලුවක් ලෙස ගෙන එය විසඳා ගන්නා ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පිවිසීම : සමාජ ගැටලු හා සම්බන්ධ පුවත්පත් වාර්තා කොටස් සිසුන්ට බෙදා දී කියවීමට සැලැස්වීම හෝ රූපවාහිනි වෙළඳ දැන්වීම් දැක්වෙන වීඩියෝවක් ප්‍රදර්ශනය කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ඉහත කරුණු අනුසාරයෙන් සමාජ ගැටලු උද්ගත වී ඇති අකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| එක් ගැටලුවක් තවත් සමාජ ගැටලු උත්පාදනය වීමට බලපාන අයුරු පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලුවලින් සමාජයට වන බලපෑම සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

* පහත සඳහන් සමාජ ගැටලුව අතරින් එකක් ගෙන එය තවත් සමාජ ගැටලු ජනනය වීමට මුල් වන ආකාරය පැහැදිලි කරන්න.

(අ). මදිරාබාධය (ආ) දූප්පත්කම

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකාව : 01**

01. A තීරුවේ ඇති සමාජ ගැටලු නිරාකරණය කිරීමට මැදිහත් වන රාජ්‍ය ආයතන B තීරුවෙන් තෝරා යා කරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| මදිරාබාධය | ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය |
| දූප්පත්කම | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| කසළ කළමනාකරණ ගැටලුව | පොලීසිය හා අධිකරණය |
| වකුගඩු රෝගය | සමෘද්ධි අධිකාරිය |
| ළමා අපයෝජනය | ප්‍රාදේශීය සභාව/ නගර සභාව |

02. ඔබ කණ්ඩායමට නියමිත සමාජ ගැටලුව ගෙන එයින් සමාජයට වන අහිතකර බලපෑම් 2 ක් ලියන්න.

A කණ්ඩායම : ළමා අපයෝජනය

B කණ්ඩායම : වකුගඩු රෝගය

**නිපුණතාව** - සමාජ ගැටලු හඳුනා ගැනීම.

නිපුණතා මට්ටම - 6.4 ගැටලු වලින් සමාජය මුදවා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලු වළක්වා ගැනීමට අවශ්‍ය බෞද්ධ ඉගැන්වීම් හඳුනා ගනියි.
2. සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් භාවිත කරයි.
3. සමාජ ගැටලු නිරාකරණයෙහි ලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව අගය කරයි.

හැඳින්වීම - බුදුදහම මානව හිතවාදී ආගමකි. එවැනි ආගමකින් සමාජ ශෝධනය සඳහා ඉටුවන කාර්යභාරය ඉතා විශාලය. එක අතකින් සමාජශීලි සාමාජිකයෙකු නිර්මාණය කර ගැනීම සඳහා බුදු දහම මගින් මග පෙන්වනු ලබයි. අනෙක් අතින් වරදට යොමු වූවන් නිවැරදි කර යළිත් සමාජයට හිතකර සත් පුරුෂයන් බවට පත් කරලීම සඳහා ද බුදු දහම මගින් ඉටු කරනු ලබන කාර්යභාරය ඉතා විශාලය. වසර දෙදහස් පන්සියයකටත් වැඩි කාලයක් තිස්සේ මහත් වූ මෙම සමාජ මෙහෙවර ඉටු කිරීමේ වගකීම උර දරන්නේ භික්ෂූන් වහනසේ ය. සමාජ ගැටලු වළක්වා ගැනීමේ ලා මග පෙන්වනු ලබන ධර්ම කරුණු බොහෝ තැන්වල දැකිය හැකි වේ.

* පංචසීල ප්‍රතිපදාව
* චතුරාර්ය සත්‍ය
* සිගාලෝවාද සූත්‍රය
* හේතුඵල සංකල්පය
* මහා මංගල සූත්‍රය
* සතර සංග්‍රහ වස්තු
* දසරාජ ධර්මය
* දස සක්විති වත්

යනාදිය ඒ සඳහා නිදසුන් කිහිපයකි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* ප්‍රදර්ශන ක්‍රමය
* පරීක්ෂණ ක්‍රමය
* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. බෞද්ධ ඉගැන්වීම් මගින් සමාජ ගැටලු නිරාකරණයට මඟ පාදා ගනියි.
2. ඕනෑම සමාජ ගැටලුවක් නිරාකරණය සඳහා බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කිරීමට ක්‍රියා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* කාර්ය පත්‍රිකා.
* අදාළ සූත්‍ර දේශනා ඇතුළත් ත්‍රිපිටක පොත්.
* ධර්ම ග්‍රන්ථ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

පහත සඳහන් සූත්‍ර හා ධර්ම කරුණු මගින් සමාජ ගැටලු නිරාකරණය කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න.

- ✳ පංචශීල ප්‍රතිපදාව.
- ✳ චතුරාර්ය සත්‍යය
- ✳ හේතුඵල සංකල්පය
- ✳ මහා මංගල සූත්‍රය
- ✳ සිගාලෝවාද සූත්‍රය
- ✳ සතර සංග්‍රහ වස්තු
- ✳ දස රාජ ධර්මය
- ✳ දස සක්විති වත්

**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සූත්‍ර හා ධර්ම කරුණු ඇතුළත් පොත් ප්‍රදර්ශනය කරන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ඒවායෙහි අන්තර්ගත කරුණු සිසුන් සමග සොයා වෙන් වෙන්ව පෙළ ගස්වන්න. | පරීක්ෂණ ක්‍රමය |
| පෙළ ගස්වන ලද කරුණු එකින් එක සමාජ ගැටලු විසදා ගැනීම සඳහා භාවිත කළ හැකි අයුරු වෙන වෙනම පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකා ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| පන්තියට වාර්තා ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රති පෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- ✳ පහත සඳහන් සමාජ ගැටලු අතරින් එකක් තෝරා ගෙන එය විසඳීම සඳහා යොදා ගත හැකි බෞද්ධ ඉගැන්වීම් තුනක් නම් කරන්න.

  (අ). දුප්පත්කම (ආ). මදිරාබාධය
  (ඇ). කැළි කසළ උවදුර

- ✳ ඔබ තෝරාගත් සමාජ ගැටලුව විසඳීම සඳහා ඉහත නම් කළ බෞද්ධ ඉගැන්වීම් අතරින් එකක් උපකාරී වන ආකාරය විස්තර කරන්න.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව : 01**

A - කණ්ඩායම : ළමා අපයෝජනය

B - කණ්ඩායම : දුප්පත්කම

ඉහත දක්වන ලද සමාජ ගැටලු විසඳීමට යොදා ගත හැකි බෞද්ධ ඉගැන්වීම් මොනවාදැයි කරුණු වශයෙන් පෙළ ගස්වන්න. එම කරුණු පන්තියට විස්තර කර දෙන්න.

# 07. සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කිරීම.

**නිපුණතාව** - සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගනියි.

**නිපුණතා මට්ටම** - 7.1 සරල සමාජ විද්‍යා පර්යේෂණ යනු කුමක් දැයි හඳුනා ගනියි.

7.2 ගැටලු විසඳීමේ දී පර්යේෂණවල කාර්‍ය්‍ය භාරය අවබෝධ කර ගනියි.

7.3 සරල සමාජ විද්‍යා පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 10

**හැඳින්වීම** - පර්යේෂණයක් යනු කුමක් ද? යන්න විවරණය කරමින් ඉදිරිපත් වූ අදහස් බොහෝ ය. යම් ගැටලුවක් පිළිබඳ විද්‍යාත්මක විධික්‍රම ඔස්සේ සොයා බැලීම පර්යේෂණ (Research) නම් වේ. පර්යේෂණ යනු විද්‍යාත්මක සොයා බැලීමේ කලාව ලෙස ද අර්ථ ගැන්විය හැකිය. මිනිසාගේ සමාජ චර්යාව පිළිබඳ විද්‍යාත්මක ව හදාරණ විෂය සමාජ විද්‍යාව යි. ඕනෑම සමාජ අවස්ථාවක් හා සම්බන්ධ විද්‍යාත්මක දැනුම එක් රැස් කර ගැනීමේ දී සමාජ විද්‍යාවට ද පර්යේෂණ කිරීමට සිදු වේ. සමාජ විද්‍යාත්මක පර්යේෂණ කොටස් දෙකකට බෙදනු ලැබේ. එනම්,

01. මූලික පර්යේෂණ

02. ප්‍රායෝගික පර්යේෂණ

**නිපුණතාව** - සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගනියි.

**නිපුණතා මට්ටම** - 7.1 සරල සමාජ විද්‍යා පර්යේෂණ යනු කුමක් දැයි හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02

**ඉගෙනුම් පල**

1. නිර්වචන ඇසුරින් පර්යේෂණයක් යනු කුමක් දැයි පැහැදිලි කරයි.
2. තොරතුරු ගවේෂණය සඳහා පර්යේෂණවල වැදගත්කම පැහැදිලි කරයි.
3. පර්යේෂණ විධික්‍රම යනු සමාජ විද්‍යාවේ ප්‍රධාන උප විෂයයක් බව පෙන්වා දෙයි.

**හැඳින්වීම** - පර්යේෂණයක් යනු බුද්ධිමය ක්‍රියාවලියකි. එමගින් නව දැනුම උත්පාදනය කර ගැනීමටත්, පවත්නා දැනුම වැඩිදියුණු කර ගැනීමටත්, ගැටලුවකට විසඳුම් ලඟා කර ගැනීමටත් හැකි ය. වෙබ්ස්ටර් ශබ්දකෝෂයට අනුව "පර්යේෂණයක් යනු කිසියම් දැනුම් ක්ෂේත්‍රයකට අයත් මූලධර්ම, ප්‍රායෝගීකරණය හෝ තහවුරු කිරීම සඳහා ප්‍රවේශමෙන් හා ඉවසීමෙන් කරනු ලබන විධිමත් පරීක්ෂාවකි." මේ අනුව පවත්නා දැනුම තහවුරු කිරීම සඳහා හෝ නව දැනුම නිර්මාණය කර ගැනීම සඳහා හෝ සංයමයෙන් යුතුව විධිමත්ව සොයා බැලීම පර්යේෂණයක් ලෙස දැක්විය හැකි ය. චන්ද්‍රා ජයසූරියට අනුව පර්යේෂණයක් යනු, දැනුම වැඩිදියුණු කර ගැනීම සඳහා කරනු ලබන ක්‍රමවත් විමර්ශනයකි. දැනුම සොයා යාමේ දී ක්‍රමවත් බවක් පැවතිය යුතු බව මෙමගින් දක්වා ඇත. මෙම ක්‍රමවත් බව තහවුරු වන්නේ විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් ය.

විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කර ගෙන කරනු ලබන පර්යේෂණයක මූලික පියවර පහක් අන්තර්ගත වන්නේ ය.

1. ගැටලුව හඳුනාගැනීම

   අධ්‍යයනය කිරීමට තරම් යෝග්‍ය ගැටලුවක් තිබිය යුතු ය.

2. උපන්‍යාස හෙවත් කල්පිත ගොඩ නැගීම

   තෝරාගත් ගැටලුවට පදනම් වන්නේ යැයි නිර්ණය කරනු ලබන උපකල්පනාත්මක හේතු.

3. ගැටලුවට අදාළ දත්ත එකතු කිරීම

   සැලසුම් කළ පරිදි ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණය, ලේඛන පරිශීලනය ආදී ක්‍රම භාවිත කර තොරතුරු රැස් කිරීම.

4. දත්ත විශ්ලේෂණය

   එකතු කර ගන්නා ලද දත්ත ක්‍රමානුකූලව පෙළගස්වා ඒවායින් පිළිබිඹු වන යථා තත්ත්වය විශ්ලේෂණය කර දැක්වීම.

5. නිගමන හා යෝජනා

දත්ත විශ්ලේෂණ අදියරට එන විට ලබා ගෙන ඇති අවබෝධය මත ගැටලුවට අදාළ හේතු නිගමන ලෙසත් එය විසඳීම සඳහා යොදාගත හැකි පිළියම් යෝජනා ලෙසත් ඉදිරිපත් කරයි.

මෙම විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන පර්යේෂණ කාර්යයෙහි යෙදීමෙන් පර්යේෂකයාටත්, සමාජයටත් ප්‍රයෝජන රැසක් අත්පත් කර ගත හැකි ය. ඒ අතර නව දැනුමක් නිර්මාණය වීම. පවත්නා තත්ත්වය අවබෝධ කර ගත හැකි වීම, ගැටලුවට විසඳුම් යෙදිය හැකි වීම, පැරණි දැනුම සංවර්ධනය කර ගැනීමට හැකි වීම, අනාවැකි පළ කිරීමට හැකි වීම, පර්යේෂණ සංස්කෘතියක් බිහි වීම, අනාගත පර්යේෂණ සඳහා ඉඟි සැපයීම, තාර්කික දැනුමක් උත්පාදනය වීම ආදිය පෙන්වා දිය හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ✳ සාකච්ඡා ක්‍රමය
- ✳ ප්‍රදර්ශනය
- ✳ ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණයක් සාර්ථක කර ගැනීමට සමාජයේ පාර්ශවයෙන් ද මනා සහයෝගයක් ලබා දිය යුතු බව පෙන්වා දෙයි.
2. පර්යේෂණයක් කිරීමට යෑමේ දී පර්යේෂණ ක්ෂේත්‍රයට අනුගත වන අයුරු වටහා ගනියි.
3. වඩාත් නිවැරදි තොරතුරු ලබා ගැනීමට පර්යේෂණයක් මගින් කෙරෙන කාර්යභාරය අගයයි.
4. පර්යේෂණයක දී තොරතුරු එක් රැස් කර ගන්නා ආකාරය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ✳ නිර්වචන ලියන ලද පුවරු
- ✳ පෑන්, පැන්සල්, බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ පර්යේෂණයක් යන්න පැහැදිලි කිරීම සඳහා නිර්වචන දෙකක් යොදා ගන්න.
- ✳ නිර්වචන විග්‍රහ කරමින් සරල පර්යේෂණයක් කරන අයුරු පහදන්න.
- ✳ ගැටලු නිරාකරණය කර ගත හැකි වන්නේ පර්යේෂණයෙන් ලබා ගන්නා තොරතුරු මත ක්‍රියා කිරීමෙන් බව පැහැදිලි කරන්න.
- ✳ සමාජ විද්‍යාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා පර්යේෂණ කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**


| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| නිර්වචන ලියන ලද පුවරු ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසෙන්න. | ප්‍රදර්ශන |
| ඉදිරිපත් කරන ලද නිර්වචන අනුසාරයෙන් පර්යේෂණයක් යන්න වටහා ගැනීමට මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| එදිනෙදා ජීවිතයේ දී මිනිසා මුහුණ දෙන ගැටලු විසඳ ගැනීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග සිසුන්ගෙන් විමසන්න. | ඉදිරිපත් කිරීම කේවල ක්‍රමයට<br><br>හෝ කණ්ඩායම් ක්‍රමය |
| පර්යේෂණ මඟින් ලබා ගන්නා තොරතුරු මත නිගමනවලට එළඹෙන ආකාරය පැහැදිලි කරන්න. අදාළ කරුණු සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- පර්යේෂණ යන්න අර්ථ දැක්වීම සඳහා යෝග්‍ය නිර්වචන දෙකක් ලියා දක්වන්න.
- පර්යේෂණයක් යනු කුමක් දැයි හඳුන්වන්න.
- ''එදිනෙදා ජීවිතයේ දී ගැටලුවක් පැමිණි විට විසදා ගැනීමට පර්යේෂණ ක්‍රමය භාවිත කරයි''. උදාහරණ සහිතව විස්තර කරන්න.


**ඇමුණුම 01**

විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමය,




විද්‍යාත්මක ක්‍රමය

**ඇමුණුම 02**




ගැටලු විසඳීමේ පියවර

**නිපුණතාව** - සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගනියි.

**නිපුණතා මට්ටම** - 7.2 ගැටලු විසඳීමේ දී පර්යේෂණවල කාර්ය භාරය අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 04 යි.**

**ඉගෙනුම් පල**

1. පර්යේෂණවල ඇති වැදගත්කම පැහැදිලි කරයි.
2. ගැටලු නිරාකරණය කර ගැනීමේ දී පර්යේෂණවලින් ලබා ගන්නා තොරතුරු වැදගත් වන බව අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
3. පර්යේෂණයකින් රැස් කර ගනු ලබන තොරතුරු විශ්ලේෂණය කර සමාජයේ යහපත සඳහා යොදා ගත හැකි බව උදාහරණ සහිතව පෙන්වා දෙයි.
4. ගැටලු නිරාකරණ කර ගැනීම සඳහා පර්යේෂණවලින් හෙළි කර ගනු ලබන තොරතුරු යොදා ගත හැකි බව පෙන්වා දෙයි.

**හැඳින්වීම -** මිනිසා මුහුණ දෙන සමාජ ගැටලු නිරාකරණය කර ගත යුතුය. ඒ සඳහා ගැටලුව ක් නිර්මාණය වීමට මුල් වන හේතු සාධක නිවැරදි ව අනාවරණය කර ගත යුතුය. එකී හේතුව ඉවත් කිරීමෙන් ගැටලුව නිරාකරණය කර ගත හැකි ය. ඒ හේතු සාධක අනාවරණය කර ගැනීමේ පදනම විද්‍යාත්මක විශ්ලේෂණය යි. එහෙයින් මේ පිළිබඳ අවබෝධයකින් යුත් සිසුන් හට මෙහිලා පර්යේෂණවල වැදගත්කම තේරුම් ගැනීමට හැකි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණයකින් ලැබෙන තොරතුරු මත ගැටලු නිරාකරණයට යොමු විය හැකි බව වටහා ගනියි.
2. සමාජීය ජීවිතයේ දී උද්ගත වන ගැටලු විසඳීම සඳහා පර්යේෂණාත්මක දැනුම යොදා ගන්නා අයුරු වටහා ගනියි.
3. පර්යේෂණ මගින් සොයා ගන්නා තොරතුරු සමාජ ප්‍රගමනය සඳහා යොදා ගත හැකි අයුරු අවබෝධ කරගෙන පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

* පර්යේෂණවල ඇති වැදගත්කම සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුම අවදි කිරීම සඳහා සාකච්ඡාවක යෙදෙන්න.
* තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන ක්‍රමවේදය පර්යේෂණය බව තහවුරු කරන්න.
* සමාජ ප්‍රගමනයේ දී පර්යේෂණවල වැදගත්කම නිදසුන් මගින් පෙන්වන්න.


**ක්‍රියාකාරි සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
| --- | --- |
| පර්යේෂණයක් මගින් තොරතුරු ලබා ගන්නා අයුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (ඇමුණුම 02) | සාකච්ඡා ක්‍රමය |
| පර්යේෂණකින් ලබා ගන්නා තොරතුරු සමාජ ප්‍රගමනයට යොදා ගන්නා අයුරු පැහැදිලි කිරීම සඳහා සිසුන් ක්‍රියාකාරකම්වල යොදවන්න. | කාණ්ඩායම් හෝ කේවල වශයෙන් |
| පර්යේෂණයක් කරන ආකාරය පුවත් පත් වාර්තා ආශ්‍රයෙන් පෙන්වන්න. | ප්‍රදර්ශනය කිරීම |
| හැකිනම් පර්යේෂණ වාර්තා කිහිපයක් පෙන්වන්න. (ඇමුණුමේ සටහන් කර ඇත 01) | ප්‍රදර්ශනය කිරීම |


**ඇගයීම හා තක්සේරුකරණය**

* පර්යේෂණයක් යනු කුමක් ද? ඔබ ඉගෙනගත් නිර්වචන 02 ක් ඇසුරින් පහදන්න.
* පර්යේෂණයකින් ලබාගත හැකි ප්‍රයෝජන 05 ක් ලියා දක්වන්න.
* පර්යේෂණයකින් තොරතුරු ලබා ගැනීම වැදගත් වන්නේ ඇයි? කෙටියෙන් විස්තර කරන්න.

ඇමුණුම 01



**ඇමුණුම 2**



පර්යේෂණ ක්‍රියාවලිය
පර්යේෂණ මාතෘකාව
ජනගහනය (නියැදි ඒකක)
දත්ත රැස් කිරීම
දත්ත විශ්ලේෂණය
පර්යේෂණ ගැටලුව
නියැදිය
නිරීක්ෂණ අවස්ථාව
පර්යේෂණ වාර්තාව

**නිපුණතාව** - සරල සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගනියි.

**නිපුණතා මට්ටම** - 7.3 සරල සමාජ විද්‍යා පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 04 යි.

**ඉගෙනුම් පල**

1. පර්යේෂණයක අන්තර්ගත එක් එක් පියවර නිවැරදිව ඉදිරිපත් කරයි.
2. පර්යේෂණයකින් ලබා ගන්නා තොරතුරු සමාජ ප්‍රගමනයට යොදා ගන්නා ආකාරය පැහැදිලි කරයි.

**හැඳින්වීම** - පර්යේෂණයක් කිරීමේ දී අනුගමනය කරන සමස්ත ක්‍රියාදාමය පර්යේෂණ ක්‍රියාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ. පර්යේෂණ ක්‍රියාවලිය මූලික පියවර කිහිපයක් යටතේ සංවිධානය කර ගත යුතු ය. පළමුව පර්යේෂණය සඳහා ගැටලුවක් තෝරා ගත යුතු ය. දෙවනුව ඒ සඳහා යෝග්‍ය සමාජයක් හෙවත් ක්ෂේත්‍රයක් තෝරා ගනු ලැබේ. තෙවනුව තොරතුරු රැස් කිරීම සඳහා වඩාත් යෝග්‍ය විධික්‍රම නිශ්චය කරනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

* සාකච්ඡා ක්‍රමය
* කණ්ඩායම් ක්‍රමය
* ඉදිරිපත් කිරීම
* වීඩියෝ දර්ශන

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් කරන අයුරු වටහා ගනියි.
2. පර්යේෂණ විධික්‍රම යොදා ගනිමින් සරල පර්යේෂණයක් කරන ආකාරය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

* පෑන්, පැන්සල්
* ලිපි ද්‍රව්‍ය
* පුවත් පත් හා සඟරා
* විඩියෝ තැටි
* අවශ්‍ය අනෙකුත් දේවල්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ✳ පර්යේෂණයක් කිරීමට අවශ්‍ය පියවර විස්තරාත්මකව පැහැදිලි කර දෙන්න.
- ✳ පර්යේෂණවල තොරතුරු නිසි අයුරින් යොදා ගැනීමෙන් සමාජ ප්‍රගමනය ළඟා කර ගත හැකි බව උදාහරණ සහිතව පෙන්වා දෙන්න.
- ✳ පර්යේෂණය දෛනික ජීවිතයට වැදගත් වන අයුරු උදාහරණ මගින් සිසුන්ට පෙන්වා දෙන්න.
- ✳ පර්යේෂණ ක්‍රියාවලිය අත්හදා බැලීමට තමන්ට ද හැකි බව සිසුන්ට පහදා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පර්යේෂණයක් යනු කුමක් ද? යන්න පිළිබඳව සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| පර්යේෂණයක් කරන අයුරු ආකෘතියක් මගින් සිසුන්ට පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| අසල්වැසි පන්ති කාමරයේ සිසුන් සමග පර්යේෂණ ක්‍රියාකාරකමක යොදවන්න. ( කාලය, විනාඩි 15) ඇමුණුම 01 (උදාඃ ප්‍රශ්නාවලියක් සැකසීම). | කේවල හෝ කණ්ඩායම් වශයෙන් |
| සාර්ථකව නිමකරන ලද පර්යේෂණ කෘති පෙන්වමින් සිසුන් තුළ උද්යෝගය ඇති කර වන්න. | ප්‍රදර්ශනය ක්‍රමය |
| තම නිවසට ගොස් පර්යේෂණයක් කර ගෙන ඒමට අවශ්‍ය කටයුතු සලසන්න. (Home work) (අවශ්‍ය පර්යේෂණ ආකෘති පත්‍රිකාවක් ද ලබා දෙන්න) | සාකච්ඡා ක්‍රමය |
| කැමති මාතෘකාවක් ඔස්සේ පර්යේෂණයක් කිරීමට අවශ්‍ය මග පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය**

- ✳ පර්යේෂණයක් මගින් තොරතුරු ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු පියවර මොනවාද ?
- ✳ පර්යේෂණයක් මගින් තොරතුරු ලබා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 5 ක් ලියන්න.
- ✳ පර්යේෂණයක් කිරීමට යෑමේ දී ඇති විය හැකි ගැටලු මොනවාද? උපකල්පනය කර ලියන්න.
- ✳ පර්යේෂණයෙන් ලැබෙන තොරතුරු සමාජ ප්‍රගමනයට හේතුවෙන අයුරු පහදන්න.

**ඇමුණුම 01**

I. ප්‍රශ්ණාවලියක් සකස් කිරීමේ පියවර

පියවර - 01 ප්‍රශ්න වර්ග තීරණය කිරීම.

පියවර - 02 පළමු දළසටහන ගොඩ නැගීම.

පියවර - 03 පසු විපරම හා ප්‍රශ්නාවලිය සැකසීම.

පියවර - 04 විශේෂඥයෙකු ලවා පරීක්ෂා කරවීම.

පියවර - 05 නැවත පරීක්ෂා කිරීම.

පියවර - 06 නියමු අධ්‍යයනය පැවැත්වීම.

පියවර - 07 අඩු පාඩු සැකසීම.

පියවර - 08 අවසාන පිටපත සකස් කිරීම.

ඉහත පියවර අනුගමනය කරමින් සුදුසු මාතෘකාවක් පදනම් කරගෙන ප්‍රශ්නාවලියක් නිර්මාණය කරන්න.

**ඇමුණුම 02**

වියදම් ඇස්තමේන්තුව

පර්යේෂණය සඳහා යෙදවීමට අපේක්ෂිත මුදල පිළිබඳ දළ ඇස්තමේන්තුවක් මෙහි දී ඉදිරිපත් කළ යුතුයි. එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

වියදම් ඇස්තමේන්තුව සකසා ගැනීම

| | අයිතමය | මුදල |
|---|---|---|
| 01. | ලිපි ද්‍රව්‍ය | XX |
| 02. | පර්යේෂණ පුහුණු කටයුතු සඳහා වියදම | XXX |
| 03. | පර්යේෂකයින්ගේ දෛනික දීමනා සහ වියදම් | XXX |
| 04. | ක්ෂේත්‍ර කටයුතු සඳහා | XXX |
| 05. | දත්ත විශ්ලේෂණය සඳහා | XXX |
| 06. | වාර්තාව සකස් කිරීම සඳහා | XXX |
| 07. | සෞඛ්‍ය කටයුතු සඳහා | XXX |
| 08. | වෙනත් වියදම් | XXX |
| | එකතුව | XXXXX |